# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்தசெயல் நிறைவேற்றுகை

# Annual Performance Report

# 2017

රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

பொது நிர்வாக, முகாமைத்துவ மற்றும் சட்டம் ஒழுங்கு அமைச்சு

Ministry of Public Administration, Management and Law & Order

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2017

**රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ**

**නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය**

**14 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර,**

**බත්තරමුල්ල.**

“වර්ෂ 2018 මැයි මස 12 වන දින අංක 2070/56 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය ලෙස අමාත්‍යාංශයේ විෂය පථය සංශෝධනය වූවද මෙම වාර්තාවෙන් පිළිබිඹු වනුයේ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය ලෙස පැවති අමාත්‍යාංශයේ කාර්යය භාර්යයේ 2017 ජනවාරි මස 01 වන දින සිට 2017 දෙසැම්බර් මස 31 වන දින දක්වා වර්ෂයේ කාර්ය සධනය වේ.”

# පටුන


පිටු අංකය

01. හැඳින්වීම 01 - 07

දැක්ම 04

මෙහෙවර 04

අරමුණු 05

කාර්යයන් හා කර්තව්‍යයන් 06

අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය 07

02. අමාත්‍යාංශ සමස්ත කාර්ය සාධනය 08 - 27

2.1. රටේ සාමාන්‍ය ජන ජීවිතයේ ස්ථාවරත්වය පවත්වාගෙන යාමට ලබාදුන් සහයන් අතරින් 08 - 15

2.2. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල කාර්යභාරය කාර්යක්ෂම හා ඵලදායි කිරීමට අවශ්‍ය පියවර ගනිමින් 15 - 17

2.3. දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණට ළඟා වීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් 17

2.4. ශ්‍රී ලංකා ජාත්‍යන්තර සහයෝගීතාවය 18 - 19

2.5. අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රගතිය ඉහළ නැංවීමට පියවර ගනිමින් 19 - 20

2.6. අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කාර්යය ප්‍රගතිය 20 - 23

2.7. අධීක්ෂණය කරන ලද සංවර්ධන ව්‍යාපෘති වල කාර්යසාධනය 23 - 28

03. ආංශීය කාර්ය සාධනය 29 - 45

3.1. පාලන අංශය 29 - 32

3.2. පොලිස් අංශය 33 - 34

3.3. මූල්‍ය අංශය 35 - 41

3.4. සැලසුම් අංශය 42 - 43

3.5. සංවර්ධන අංශය 44

3.6. අභ්‍යන්තර විගණන අංශය 45

## සංඛ්‍යා වගු විස්තර


| වගු අංකය | නම | පිටු අංකය |
| --- | --- | --- |
| 01 | 2017.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය | 07 |
| 02 | අපරාධ වර්ග අනුව වාර්තාවීම් සහ ප්‍රගතිය | 08 |
| 03 | කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ වාර්තාවීම් හා විසඳීම් | 09 |
| 04 | රථවාහන අනතුරු | 10 |
| 05 | නිද්‍රාජනක ද්‍රව්‍ය | 10 |
| 06 | නිද්‍රා ජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය | 11 |
| 07 | දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි | 11 |
| 08 | විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම් | 12 |
| 09 | ප්‍රජා පොලිස් කමිටු | 13 |
| 10 | සිදු කරන ලද දැනුවත් කිරීම් සහ ක්‍රියාකාරකම් | 13 |
| 11 | මහජන දුක්ගැනවිලි ලද හා විසඳූ සංඛ්‍යාව | 15 |
| 12 | පැවැත්වූ වැඩසටහන් පිළිබඳ විස්තර | 22 |
| 13 | වැඩ නිමකළ පොලිස් ස්ථාන | 25 |
| 14 | දක්ෂිණ ප්‍රදේශය සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය | 26 |
| 15 | කාර්ය මණ්ඩල වෙනස්වීම් - 2017 | 28 |
| 16 | දේශීය පුහුණු | 30 |
| 17 | අමාත්‍යාංශයීය මාණ්ඩලික නිලධාරීන්ගේ විදේශීය පුහුණු පිළිබඳ විස්තර | 31 |
| 18 | මුල්‍ය ප්‍රතිපාදනය හා උපයෝජනය - 2017 | 35 |
| 19 | මුල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය ව්‍යාපෘති අනුව විස්තරාත්මකව - 2017 | 36 |
| 20 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම - 2017 වර්ෂය | 37 |
| 21 | විමධ්‍යගත අය වැය වැඩසටහන ප්‍රගතිය | 43 |

# 01. හැඳින්වීම

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය, තිරසාර සංවර්ධනයේ මූලික සංඝටකයන් වන ආර්ථික හා සමාජීය ද්විත්ව පැතිකඩයන්හි ඉලක්කගත වර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබන අමාත්‍යාංශයකි. සාමකාමී රටක සමබර සංවර්ධන පිළිවෙතට අවතීර්ණය වීමේ අභිලාෂයෙන් 2015.11.24 දිනැති අංක 1942/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම අමාත්‍යාංශය පිහිටුවන ලදී. අමාත්‍යාංශයට පැවරුණු විෂය පථයන් ඔස්සේ රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව 2017 වර්ෂයේ සකස් කරන ලද සැලසුම් වලට අනුව රට තුළ නීතිය හා සාමය තහවුරු කිරීමට හා දක්ෂිණ ප්‍රදේශ සංවර්ධනය සඳහා කටයුතු කරන ලදී.

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පොලීසියත්, විශේෂ කාර්ය බලකායත් නීතිය හා සාමය පවත්වාගෙන යෑම, අපරාධ, ප්‍රචණ්ඩත්වය, හිංසනය හා නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම, අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීම සහ සමාජ විනය තහවුරු කිරීම සඳහා ක්‍රියා කරමින් සිටියි. මෙකී කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික පොලිස් කොමිසන් සභාවෙන් ද අනගි සහයක් ලබා දේ. එසේම රටේ ව්‍යසනයක්ව පවතින අන්තරායකර ඖෂධ පාලනය හා වැළැක්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසියත්, විශේෂ කාර්ය බලකායත්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයත් සමඟ කටයුතු කරමින් සිටියි.

දළ දේශීය නිෂ්පාදිතයට දක්ෂිණ කලාපයෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම තුළින් එම කලාපය තුළ ජීවත්වන ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්කවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණ. එහිදී දිස්ත්‍රික් මට්ටමින් ප්‍රමුඛතාවය දැක්විය යුතු ව්‍යාපෘති හඳුනාගෙන ඒවාට ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කරමින් අමාත්‍යාංශය දක්ෂිණ සංවර්ධනය වෙනුවෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකරන ලදී. ඒ සඳහා අමාත්‍යාංශය යටතේ වන දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලය හා ගාලු උරුමය පදනම තුළින් දායකත්වය ලබා ගැනිණ.

සමස්තයක් ලෙස සලකා බැලීමේ දී රටේ නීතිය හා සාමය සුරක්ෂිත කිරීම, රථවාහන ගමනාගමනය හා මාර්ග ආරක්ෂාවට සුදුසු ක්‍රියා මාර්ග ගැනීම, අන්තරායකර ඖෂධ සංසරණය හා භාවිතය පාලනය හා වැළැක්වීම, දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය සඳහා ඵලදායී සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම් විධිමත් කිරීම යන අමාත්‍යාංශයේ ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කරමින් රටේ සංවර්ධන කාර්යයට සහාය දැක්වීමට 2017 වර්ෂයේදී ද මෙම අමාත්‍යාංශය කටයුතු කළ අතර අමාත්‍යාංශ විෂය පථය ඔස්සේ ප්‍රතිපත්ති සැකසීම, මඟපෙන්වීම, ක්‍රියාකාරීත්වය අධීක්ෂණය, කාර්ය සාධන ඇගයීම සහ පසුවිපරම් කටයුතු සඳහා අවශ්‍ය සියලු කටයුතු තවදුරටත් ඉටුකරමින් සිටී.

## මාර්ගෝපදේශකත්වය තහවුරු කරමින්...............

"නව ව්‍යවස්ථා සංශෝධනයක් මඟින් අධිකරණ, පොලීසිය, මැතිවරණ, විගණන හා නීතිපති වැනි ආයතනවල අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීම පිණිස ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරමි."

"රාජ්‍ය සේවය, ආණ්ඩුවේ ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන බව හා අපක්ෂපාතීව ක්‍රියා කරන බව තහවුරු කිරීම සඳහා රාජ්‍ය සේවය හා පොලීසිය සඳහා නිර්දේශපාලනික කුසලතා පදනමක් හඳුන්වා දෙන්නෙමි."

"සියලු තරාතිරම්වල පුද්ගලයන්ගේ නොමනා ක්‍රියා නිසා රටතුළ ඇදහිය නොහැකි පරිමාණයෙන් වර්ධනයවී ඇති දරුවන් හා කාන්තාවන් ගොදුරුවන අපචාර වළක්වාලීමට උපරිම ක්‍රියාමාර්ග ගන්නා අතර ඊට අදාල නඩු විභාග ඉතා කෙටි කලකදී අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නෙමි. එමඟින් ළමා හා කාන්තා දූෂණ සහමුලින්ම නවතාලීමට කටයුතු කරන්නෙමි."

(මෛත්‍රී පාලනයක් ... ස්ථාවර රටක් ප්‍රතිපත්ති ප්‍රකාශනය - පිටු අංක 16)

"මත්කුඩුජාවාරම්කරුවන් මැඩලීම සඳහා ජාතික ඔත්තු සේවය, විශේෂ කාර්ය බලකාය, ශ්‍රීලංකා රේගුව, අන්තරායකර ඖෂධ පාලක අධිකාරිය ආදිය ඒකාබද්ධ කර විශේෂ බලකායක් ස්ථාපිත කරන්නෙමි."

"මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් ගලවා ගැනීම සඳහා සුවිශේෂී පුනරුත්තාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට කටයුතු කරන්නෙමි."

(මෛත්‍රී පාලනයක් ... ස්ථාවර රටක් ප්‍රතිපත්ති ප්‍රකාශනය - පිටු අංක 24)

## 2017 අය වැය යෝජනා ඇසුරින්..........

"ගරු කතානායකතුමනි, මෙම ගරු සභාව මා සමඟ එකඟ වනවා ඇති. අපගේ තරුණ පරපුර මත් උවදුරින් ආරක්ෂා කර ගැනීමට අප විසින් ක්ෂණික සහ ප්‍රවේගකාරී පියවර ගතයුතු වනවා. මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගෙන සිටීම ඉදිරි පරම්පරා ගණනාවකටම ඉතාමත් අනර්ථකාරී ප්‍රතිඵල ගෙනදෙනු ඇත. ඒ අනුව, මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සඳහා මෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසියට රුපියල් මිලියන 150 ක් ද, ජාතික තරුණ සේවා සභාවට රුපියල් මිලියන 50 ක් ද වෙන් කිරීමට මා යෝජනා කරනවා."

(අංකය 330)

"වඩා යෝග්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමක් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව නවීන උපකරණ වලින් සන්නද්ධ කර ධාරිතාව වැඩිකිරීම අපේක්ෂා කරයි. ඒ සඳහා 2017 අයවැය කතාව තුලින් රුපියල් මිලියන 5,000 ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා"

(අංකය 400)

"දකුණු පළාතේ ග්‍රාමීය සනීපාරක්ෂක පහසුකම්, කෘෂිකාර්මික කර්මාන්ත, කෘෂිකර්මය ආශ්‍රිත සේවා, වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා"

(අංකය 425)

## දැක්ම

“නීති ගරුක රටක් විනය ගරුක සමාජයක් සමඟින් සංවර්ධිත දක්ෂිණ කලාපයක්”

## මෙහෙවර

“රට තුළ නීතිය හා සාමය ස්ථාපිත කිරීම, අන්තරායකාරී ඖෂධ භාවිතය පාලනය හා වැළැක්වීම සහ දක්ෂිණ ප්‍රජාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය තිරසාර පැවැත්මකින් යුතුව ඉහළ නැංවීම”

## අරමුණු

- රට තුළ ජීවත්වන සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකෙන් තොරව ජීවත්විය හැකි සාමකාමී වටපිටාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මඟ පෙන්වීම.
- ගමනාගමනය පහසු කිරීම සඳහා රථවාහන හැසිරවීම හා මාර්ග තදබදය අවම කිරීම පිළිබඳ නීති රීති සැකසීම.
- පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම උදෙසා ජාතික පොලිස් කොමිසන් සභාව සමඟ එක්ව අවශ්‍ය පියවර ගැනීම.
- අන්තරායකාරී ඖෂධ භාවිතය, සංසරණය වැළැක්වීම සහ භාවිතා කරන්නන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- හම්බන්තොට ගුවන් හා නැව්තොට ආශ්‍රිතව කර්මාන්ත හා ප්‍රවර්තන සේවා දියුණු කිරීමද ඇතුළුව දක්ෂිණ කලාපයේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය.
- දකුණු පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල සම්බන්ධීකරණ කටයුතු.

## කාර්යයන් හා කර්තව්‍යයන්

- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන විෂයයන් හා අමාත්‍යාංශය යටතට පත්කළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම.
- නීතිය හා සාමය පවත්වාගෙන යාමට මඟ පෙන්වීම.
- සමාජ විනය තහවුරු කෙරෙන පුළුල් ප්‍රතිසංස්කරණ ඇතුළත් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.
- ජාතික පොලිස් කොමිසන් සභාවේ උපදෙස් අනුව පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබෙන විවිධ අන්දමේ අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට හා මැඩ පැවැත්වීමට මඟ පෙන්වීම.
- රථවාහන ගමනාගමනය පාලනය කිරීම සඳහා මඟ පෙන්වීම.
- අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමට හා පාලනයට සහය වීම.
- කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළුව දක්ෂිණ ආර්ථික කලාපය ශක්තිමත් කිරීම සඳහා ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය.
- හම්බන්තොට ආර්ථික කලාපය, දක්ෂිණ සංචාරක සංවර්ධන කලාපය, හම්බන්තොට ගුවන් නාවික බල සැපයුම් කේන්ද්‍රය ඇතුළුව දකුණු පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
- දකුණු පළාත් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු සඳහා මඟ පෙන්වීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් අධීක්ෂණය කිරීම.

# අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

## 2017.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

සංඛ්‍යා වගුව - 01

| අනු අංක | තනතුර | සේවය | පන්තිය | වැටුප් පරිමාණය | අනුමත ගණන | | | 2017.12.31 දිනට සේවක ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් |
| 1 | ලේකම් | - | - | SL -2006 | 01 | | | 01 | | |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | විශේෂ | SL 3-2006 | 02 | | | 02 | | |
| 3 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී.ලං.ග.සේ | විශේෂ | SL 3-2006 | 01 | | | | | |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1-2006 | 03 | | | 03 | | |
| 5 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 6 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 7 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 8 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 9 | සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | II/III | SL 1-2006 | 02 | | | 01 | | |
| 10 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | II/III | SL 1-2006 | 03 | | | 03 | | |
| 11 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | II/III | SL 1-2006 | 02 | | | 02 | | |
| 12 | නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | II/III | | 01 | | | | | |
| 13 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ | අධි | MN 7-2006 A | 01 | | | 01 | | |
| 14 | භාෂා පරිවර්තක ( සිංහල-දෙමළ) | භා.ප.සේ | I/II | MN 6-2006A | 01 | | | | | |
| 15 | භාෂා පරිවර්තක ( සිංහල- ඉංග්‍රීසි) | භා.ප.සේ | විශේෂ , I | MN 6-2006A | 01 | | | 01 | | |
| 16 | සම්බන්ධීකරණ ලේකම් - ලේකම් | තාවකාලික | - | - | | 01 | | | 01 | |
| 17 | තොරතුරු සන්නිවේදන තාක්ෂණික නිලධාරී | තො.ස.තා.සේ | Class II Grade II | MN 6-2006A | 01 | | | | | |
| 18 | සංඛ්‍යා ලේඛන නිලධාරී | | I/II | | 01 | | | 01 | | |
| 19 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ | III,II,I | MN 4-2006 A | 24 | | | 16 | | |
| 20 | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | | | | 01 | | | | |
| 21 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | III,II,I | MN 2-2006 A | 40 | | | 30 | | |
| 22 | රියදුරු | රි.සේ | III,II,I විශේෂ | PL3-2006 | 15 | | | 11 | | |
| 23 | කාර්යාල කාර්ය සහයක | කා. සේ .සේ | III,II,I, විශේෂ | PL1-2006 | 18 | | | 16 | | 01 |
| 24 | කැමරා ක්‍රියාකරු සහායක | තාවකාලික | | | | 01 | | | 01 | |
| **එකතුව** | | | | | **121** | **03** | | **92** | **02** | **01** |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ පාලන අංශය*

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ අධ්‍යක්ෂ තනතුරක් දක්ෂිණ සංවර්ධන මණ්ඩලය පිහිටුවනතෙක් 2016.12.01 දින සිට අනුමත කර ඇත. කාර්යාල කාර්ය සහායක සේවයේ නියුතු නිලධාරීන් 17 දෙනාගෙන් එක් නිලධාරියකු ආදේශක පදනම මත සේවය කරනු ලබයි. අනුමත තනතුරු ලේඛනයට අමතරව අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සහකාර ලේකම්වරු දෙදෙනෙක් (02) (කම්කරු සබඳතා) මාධ්‍ය අධ්‍යක්ෂවරයෙක් (ශ්‍රී.ලං.ප.සේ.නොවන) සහ දක්ෂිණ සංවර්ධන උපදේශවරයෙකු සේවය කරයි. සංඛ්‍යා ලේඛන නිලධාරී තනතුර සඳහා සංඛ්‍යා ලේඛන සහකාරවරයෙකු අනියුක්ත කර ඇති අතර කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මගින් කාන්තා කේන්ද්‍රිය නිලධාරිනියක් ද අනියුක්ත කර ඇත.

# 02. අමාත්‍යාංශ සමස්ත කාර්ය සාධනය

රට තුළ නීතිය හා සාමය ස්ථාපිත කිරීම හා දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන කිරීම යන මූලික වගකීම දරමින් අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා 2017 වර්ෂය තුළ ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් වල සාධනය සමස්තයක් වශයෙන් රට තුළ සමාජ හා ආර්ථික වර්ධනයට බලපාන ආකාරය ප්‍රධාන කාර්ය සාධන දර්ශක 06 ක් ඔස්සේ සලකා බලනු ඇත.

- අපරාධ විසඳීමේ ප්‍රතිශතය
- මාරක රථවාහන අනතුරු සංඛ්‍යාව
- විශේෂ කාර්ය බලකාය දායකත්වය සැපයූ වැටලීම් ගණන
- ක්‍රියාකාරී සිවිල් ආරක්ෂක කමිටු හා ක්‍රියාත්මක කළ දැනුවත් කිරීම් වැඩසටහන් ගණන
- අන්තරායකර ඖෂධ භාවිතය හා සංසරණය වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ග සංඛ්‍යාව
- දක්ෂිණ කලාපයේ සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග ගණන

## 2.1. රටේ සාමාන්‍ය ජන ජීවිතයේ ස්ථාවරත්වය පවත්වාගෙන යාමට ලබාදුන් සහයන් අතරින්...

### 2.1.1. රට තුළ වාර්තාවන අපරාධ කඩිනමින් විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික මඟපෙන්වීම් ලබාදීම

අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රට තුළ අපරාධ වාර්තාවීම්වල නිරපේක්ෂ ප්‍රමාණය හා වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගයයි. අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් හා ව්‍යාපෘති හේතුවෙන් 2017 වර්ෂය තුළ අපරාධ වාර්තාවීම් ප්‍රමාණය හා අපරාධ විසඳීම් සම්බන්ධයෙන් සිදුව ඇති වෙනස්කම් පහත වගුවෙන් පෙන්නුම් කරයි. ඒ අනුව 2016 වර්ෂයේ වාර්තා වූ 1,155,215 ක් වූ අපරාධ සංඛ්‍යාව සමාලෝචන වර්ෂය තුළදී 1,140,171 ක් දක්වා අඩු වී තිබේ. ඒවාහි විසඳීම් ප්‍රගතිය 97% ක පරිසාධනයක් පෙන්නුම් කරමින් 1% ක ඉහළ යාමක් පෙන්නුම් කරයි.

**අපරාධ වර්ග අනුව වාර්තාවීම් සහ ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 02**

| අපරාධ වර්ගය | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| බල අපරාධ | 40,188 | 13,049 | 36,937 | 26,869 | 35,979 | 28,016 |
| සුළු වැරදි පුද්ගලයන්ට එරෙහි | 43,870 | 30,292 | 45,579 | 30,481 | 42,224 | 29,303 |
| සුළු වැරදි දේපල වලට එරෙහි | 30,685 | 14,407 | 33,349 | 15,969 | 32,881 | 16,664 |
| සුළු පැමිණිලි | 1,014,812 | 1,014,291 | 1,039,350 | 1,038,942 | 1,029,087 | 1,029,047 |
| එකතුව | **1,129,555** | **1,072,039** | **1,155,215** | **1,112,261** | **1,140,171** | **1,103,030** |
| ප්‍රතිශතය | | **95%** | | **96%** | | **97%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

බල අපරාධ වල විසඳුම් ප්‍රගතිය වන්නේ සැකකරුවන් අත්අඩංගුවට ගත් ප්‍රමාණය වන අතර සුළු වැරදි හා සුළු පැමිණිලි වලදී ශ්‍රී ලංකා පොලීසිය මඟින් හෝ සමථ මණ්ඩලයට යොමුකර හෝ නඩු පැවරීමෙන් විසඳුම් ලබා දී අවසන් කළ ප්‍රමාණය ප්‍රගතිය ලෙස සඳහන්කර ඇත. සමස්ත අපරාධ විසඳීම් ප්‍රතිශතය 1% ක බැගින් ක්‍රමික වැඩිවීමක් පෙන්නුම් කරන අතර එය අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පොලීසියට හා විශේෂ කාර්ය බලකාය වෙත ලබාදුන් මඟපෙන්වීම් වල සහ ඒ අනුව ගත් ක්‍රියාමාර්ග වල යහපත් පරිසාධනයකි.

## 2.1.2. කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ වැළැක්වීම හා පාලනය සඳහා අවශ්‍ය සහය ලබාදීම

ළමයින්ට එරෙහිව වාර්තාවූ අපරාධ සහ ඒවාට විසඳුම් ලබාදී ඇති ප්‍රමාණයන් මෙන්ම කාන්තාවන්ට එරෙහිව වාර්තාවූ අපරාධ සහ ඒවාට විසඳුම් ලබාදී ඇති ආකාරයන් දෙස බැලීමේදී 2015 වර්ෂයේ 68% ක් වූ විසඳීම් ප්‍රගතිය 2016 වර්ෂයේ 56% ක් දක්වා අඩු වීමක් පෙන්නුම් කළ ද එය 2017 වර්ෂයේ 73% ක විසඳීම් ප්‍රගතියක් ලඟා කර ගෙන ඇති බව පහත වගු අංක 03 හි සඳහන් දත්ත තහවුරු කරනු ලබයි. මේ සඳහා කාන්තාවන්ට එරෙහි අපරාධවල මෙන්ම ළමයින්ට එරෙහි අපරාධ වල විසඳීම් ප්‍රගතිය ඉහළ යාම හේතු වී තිබේ.

**කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ වාර්තාවීම් හා විසඳීම්**

**සංඛ්‍යා වගුව - 03**

| අපරාධ වර්ගය | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| ළමයින්ට එරෙහි අපරාධ | 5,911 | 5,102 | 5,709 | 3,294 | 5,054 | 3,711 |
| කාන්තාවන්ට එරෙහි අපරාධ | 8,288 | 4,579 | 9,042 | 4,986 | 8,444 | 6,100 |
| එකතුව | **14,199** | **9,681** | **14,751** | **8,280** | **13,498** | **9,811** |
| ප්‍රතිශතය | | **68%** | | **56%** | | **73%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.3. ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සැලසෙන පරිදි රථවාහන ගමනාගමනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

රථවාහන අනතුරු පිළිබඳ තොරතුරු යාකර ඇති පහත වගු අංක 04 අනුව, මුළු රථවාහන අනතුරු ප්‍රමාණය 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ 3% කින් අඩුවීමක් පෙන්නුම් කරන අතර ඒ සඳහා සුළු තුවාල හා අලාභ සිදුවූ අනතුරු වල පහළ යාම හේතු වී ඇති බව පෙනේ. කෙසේ වෙතත් 2017 වර්ෂය තුළ මාරක හා බරපතල අනතුරු වල ඉහළ යාමක් පෙන්නුම් කරයි. රටේ වාහන ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයක් සිදුවෙමින් පවතින අවධියක ඊට සමානුපාතිකව වාහන අනතුරු ප්‍රමාණය වර්ධනයවීමේ වේගය මේ අයුරින් පාලනය වීම සඳහා රථවාහන තදබදයට පිළියම් යෙදීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීම, රථවාහන තදබදය අවම කිරීම සඳහා රථවාහන කළමනාකරණය කිරීමට නව වැඩසටහන් හඳුන්වා දීම, රථවාහන වැරදි හා රිය අනතුරු සම්බන්ධවූවන්ට විරුද්ධව නඩු පැවරීම, දඩපත් ලබාදීම සහ ඊට අදාළව ක්‍රියාත්මක කළ වැඩසටහන් වල ප්‍රගතිය යනාදිය බලපා ඇති බව පෙන්වා දිය හැකිය

**රථවාහන අනතුරු**

සංඛ්‍යා වගුව - **04**

| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | මුළු අනතුරු | වාහන සංඛ්‍යාව | වාහන 1,000 කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| **2015** | 2,590 | 7,719 | 13,095 | 13,514 | 36,918 | 6,302,141 | 6 |
| **2016** | 2,824 | 8,148 | 14,604 | 13,510 | 39,086 | 6,795,469 | 6 |
| **2017** | 2,922 | 8,302 | 13,592 | 13,072 | 37,888 | 7,247,122 | 5 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.4. නීතිවිරෝධී මත්පැන් සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි හෙළිදරව් කරගැනීමට අවශ්‍ය පියවරයන් ගැනීම

දිවයින පුරා ක්‍රියාත්මක වන නීති විරෝධී මත්පැන් සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ සහයන් ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය වෙත ලබාදෙමින් ඊට අදාළ වැරදි හෙළිදරව් කරගැනීමටත් එම වැරදි වලට නීතිමය ක්‍රියාමාර්ග ගෙන අවසන් කිරීමටත් අවකාශය ලැබිණ. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ වාර්තා වූ නිද්‍රාජනක හා සුරා සම්බන්ධ වැරදි වලින් 95% ක් විසඳා අවසන් කිරීමට හැකියාව ලැබී ඇති බව පහත සංඛ්‍යා වගු අංක 05 මඟින් පෙන්නුම් කරනු ලබයි.

**නිද්‍රාජනක ද්‍රව්‍ය**

සංඛ්‍යා වගුව - **05**

| අනු අංක | වරද | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| 1 | නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තාවීම් සහ විසඳීම් | 89,996 | 87,846 | 88,352 | 86,330 | 107,944 | 104,641 |
| 2 | සුරා සම්බන්ධ වැරදි වාර්තාවීම් සහ විසඳීම් | 113,944 | 109,256 | 120,105 | 111,028 | 120,198 | 113,037 |
| **එකතුව** | | **203,940** | **197,102** | **208,457** | **197,358** | **228,142** | **217,678** |
| **ප්‍රතිශතය** | | | **97%** | | **95%** | | **95%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

2016 වර්ෂයට සාපේක්ෂව නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තාවීම් 2017 වර්ෂයේදී 22% කින් වර්ධනය වී ඇති අතර ඒ සඳහා දිවයින තුළ නිද්‍රාජනක ද්‍රව්‍ය ව්‍යාප්තව ඇති ආකාරය විශ්ලේෂණය කර එමඟින් වැඩිම පැමිණිලි ලැබෙන ප්‍රදේශ හඳුනාගෙන වැටලීම් සිදුකිරීම ප්‍රමුඛත්වයෙන් සලකා කටයුතු කිරීමට අදාළ උපදෙස් ලබාදීම හේතු වී ඇති බව පෙනේ. ඒ අනුව අත්අඩංගුවට ගත් නිද්‍රාජනක ද්‍රව්‍ය ප්‍රමාණයන් වගු අංක 06 මඟින් පෙන්නුම් කෙරේ.

**නිද්‍රා ජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය**

සංඛ්‍යා වගුව - 06

| නිද්‍රා ජනක ද්‍රව්‍ය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2016 | | | 2017 | | |
| | කි. ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. | කි. ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. | කි. ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. |
| ගංජා | 13,253 | 55 | 225 | 36,817 | 698 | 506 | 19,723 | 980 | 949 |
| අබිං | - | 249 | 500 | 15 | 399 | 970 | - | 02 | 575 |
| හෂිස් | 4 | 187 | 630 | 27 | 443 | 650 | 39 | 42 | 554 |
| හෙරොයින් | 44 | 521 | 89 | 205 | 147 | 430 | 124 | 829 | 51 |
| මෝෆීන් | - | - | - | - | 74 | 730 | - | - | 250 |
| කොකේන් | 81 | 672 | 333 | 1,302 | 735 | 42 | 222 | 122 | 75 |
| වෙනත් | 166 | 751 | 909 | 506 | 523 | 334 | 383 | 602 | 853 |
| **එකතුව** | **13,548** | **2,435** | **2,686** | **38,872** | **3,019** | **3,662** | **20,491** | **2,577** | **3,307** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.5. දූෂණ මර්දනය සඳහා අවශ්‍ය සහය ලබාදීම

වෛශ්‍යා වෘත්තිය, ගණිකා නිවාස පවත්වාගෙන යාම වැනි දූෂණ වැරදි 6 ක් මෙන්ම හොරෙන් විදුලිය ලබා ගැනීම, බලපත්‍ර රහිතව විවිධ ව්‍යාපාර/කර්මාන්ත වල යෙදීම, නීති විරෝධී දැව ප්‍රවාහනය, නීති විරෝධී වැලි හා පස් ප්‍රවාහනය වැනි හඳුනාගත් ව්‍යවස්ථාපිත වැරදි 31 ක් වර්තමාන සමාජයේ පැවැත්මට අහිතකර ලෙස බලපාන හෙයින් ඒවා මර්දනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම අමාත්‍යාංශ උපදෙස් හා සහායන් මත ශ්‍රී ලංකා පොලිසියේ හා විශේෂ කාර්ය බලකාය මඟින් සිදු කරණු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 වර්ෂයේදී දූෂණ වැරදි හා ව්‍යවස්ථාපිත වැරදි විසඳීම් ප්‍රතිශතය 96% ප්‍රගතියක් වාර්තා කරන බව පහත සංඛ්‍යා වගු අංක 07 විදහාපායි.

**දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි**

සංඛ්‍යා වගුව - 07

| අනු අංක | වරද | 2015 | | 2016 | | 2017 | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | ප්‍රතිශතය |
| 1 | දූෂණ වැරදි (6) | 1,796 | 1,788 | 1,255 | 1,217 | 1,055 | 1,025 | 97% |
| 2 | ව්‍යවස්ථාපිත වැරදි (31) | 46,290 | 43,896 | 46,171 | 44,177 | 49,013 | 46,857 | 95% |
| **එකතුව** | | **48,086** | **45,684** | **47,426** | **45,394** | **50,068** | **47,882** | **95%** |
| **ප්‍රතිශතය** | | | **95%** | | **96%** | | **96%** | |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.6. විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම්

රට තුළ සිදුවන අවිධිමත් හා විනාශකාරී ක්‍රියාකාරකම් මර්දනය කිරීම වෙනුවෙන් විශේෂ කාර්ය බලකාය වර්ෂය තුළ දී සැලසුම් සහගත වැටලීම් සිදුකරන ලද අතර එසේ සිදු කරන ලද වැටලීම් ප්‍රමාණය පහත සංඛ්‍යා වගු අංක 08 මඟින් ඉදිරිපත් කර ඇත.




*විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වල අවස්ථාවන්*

**විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම්**

**සංඛ්‍යා වගුව - 08**

| අනු අංක | සිදු කළ වැටලීම් | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|
| 1 | කසල තේ | 30 | 35 | 32 |
| 2 | ගවයින් ප්‍රවාහනය කිරීම | 31 | 42 | 128 |
| 3 | පාරිභෝජනයට නුසුදුසු මාංශ | 19 | 35 | 51 |
| 4 | අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය | 23 | 44 | 154 |
| 5 | මත් ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් (නීති විරෝධී මත්පැන් / රජයේ අරක්කු / විදේශ මත්පැන්) | 255 | 247 | 755 |
| 6 | වෙනත් ( වැලි, පස්, වල්ලපට්ට, නිධන් කැනීම්, දැව, මැණික් ගැරීම, දුම් වැටි ) | 336 | 702 | 4,582 |
| **එකතුව** | | **694** | **1,105** | **5,702** |

*මූලාශ්‍රය - විශේෂ කාර්ය බලකාය*

ඉහත සංඛ්‍යා වගුව මඟින් පෙන්නුම් කරන සංඛ්‍යා දත්ත අනුව විශේෂ කාර්ය බලකාය මඟින් සිදුකරන ලද වැටලීම්වල සැලකියයුතු ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. එය 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ 59% ක ඉහළ යාමක් වන අතර 2016 වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂයේ ඉහළ යෑම 416% කි. 2017 වර්ෂයේ වැටලීම් ප්‍රගතිය සඳහා ප්‍රධාන වශයෙන් මත් ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් සහ වෙනත් වැටලීම්වල වර්ධනය හේතු වී තිබේ.

## 2.1.7. ප්‍රජා පොලිස් සේවාවෙන් ජනතාවට සමීප වෙමින්

- **ප්‍රජා පොලිස් කමිටු පැවැත්වීම**

මහජන හිතකාමී ජනතා මිත්‍රශීලී පොලිස් සේවාවක් බිහි කිරීමෙහිලා ප්‍රජා පොලිස් කමිටු මඟින් ලබා දෙන දායකත්වය සුවිශේෂී වේ. ගම් මට්ටමින් කමිටු පැවැත්වීම, ප්‍රජාව දැනුවත් කිරීම සහ ඒ තුළින් ජනතාවගේ ගැටළු විසඳීම සහ අපරාධ මුක්ත සමාජයක් බිහි කිරීමේ අරමුණ කරා මෙහෙයවීමේ ප්‍රතිඵලයක් ලෙස 2017 වර්ෂය තුළ ගම් මට්ටමින් ක්‍රියාත්මක කළ කමිටු පහත වගු මඟින් දැක්වේ.

**ප්‍රජා පොලිස් කමිටු**

**සංඛ්‍යා වගුව - 09**

| පැවැත් වූ කමිටු | පැවැත්විය යුතු ගණන | පැවැත් වූ ගණන |
|---|---|---|
| පොලිස් උපදේශක සභා | 5,711 | 5,053 |
| ප්‍රජා පොලිස් මව් කමිටු | 1,985 | 2,769 |
| ප්‍රජා පොලිස් කමිටු | 168,825 | 153,854 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

- **දැනුවත් කිරීම් මඟින් අපරාධ වළක්වා ගැනීමට කටයුතු කිරීම සඳහා සහාය ලබා දීම**

ග්‍රාමීය මට්ටමින් මහජනතාව තුළ අපරාධ විරෝධී සහ අපරාධ බිය ඇති කිරීමෙන් අපරාධ වළක්වා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගයන් ලෙස දැනුවත් කිරීම් සහ මහජන සම්බන්ධතා සහිත ක්‍රියාකාරකම් හැඳින්විය හැකිය. ශ්‍රී ලංකා පොලීසියට ලබා දුන් මඟපෙන්වීම මත 2017 වර්ෂය තුළ සිදු කරන ලද විවිධ ප්‍රජා දැනුවත් කිරීම් සහ ක්‍රියාකාරකම් පහත වගු අංක 10 මඟින් දැක්වේ.

සිදු කරන ලද දැනුවත් කිරීම් සහ ක්‍රියාකාරකම්

**සංඛ්‍යා වගුව - 10**

| දැනුවත් කිරීම / ක්‍රියාකාරකම | පැවැත්වූ වැඩසටහන් ගණන |
|---|---|
| ළමා අපචාර හා ළමා හිංසනය පිළිබඳ දැනුවත් කිරීම් | 205,194 |
| අපරාධ, ළමා හිංසන, කාන්තා හිංසන, රථවාහන, මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීම් | 265,814 |
| ඩෙංගු ඇතුළු බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීම් සහ ක්‍රියාකාරකම් | 144,614 |
| පාසල් හැරගිය දරුවන් සඳහා දැනුවත් කිරීම් සහ වැඩමුළු | 11,959 |
| සමාජ සහජීවනය නංවාලීම සඳහා පැවැත්වූ වැඩසටහන් | 27,865 |
| එක් දින පොලිස් ජංගම සේවා | 45,605 |
| ජංගම පොලිස් ස්ථාන ආශ්‍රිතව පැවැත්වූ ක්‍රියාකාරකම් | 21,743 |
| වෙනත් දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් | 51,443 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.8. මහජන දුක්ගැනවිලි කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරමින්

- **අමාත්‍යාංශයේ මහජන දිනය පැවැත්වීම**





අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන ආයතන මඟින් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ හෝ ක්‍රියාත්මක නොවූ කරුණු සම්බන්ධයෙන් සහන ලබා ගැනීම, රාජ්‍ය ආයතන හා නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි හා චෝදනා යොමු කිරීම යනාදිය සඳහා මහජනතාවට අවස්ථාව ලබා දෙමින් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම්තුමා, අමාත්‍යාංශ නිලධාරීන් හා ශ්‍රී ලංකා පොලීසිය ඇතුළු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා එක්ව මෙම වසර තුළදී බදාදා දිනවල අමාත්‍යාංශ මහජන දින 14 ක් පවත්වා ඇත. එහිදී පොලිස් නිලධාරීන් විසින් ඉදිරිපත් කළ අභියාචනා හා දුක්ගැනවිලි 1,165 කින් 690 ක් සඳහා ක්‍රියා කර අවසන් කර ඇති අතර ක්‍රියාත්මක මට්ටමේ පවතින අභියාචනා සංඛ්‍යාව 39 කි. එසේම ඉදිරිපත් කළ අභියාචනා වලින් ඉටු කළ නොහැකි අභියාචනා 436 ක් වේ. මෙහිදී පොදු මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව 73 කි. ඉන් 38 ක් සඳහා විසඳුම් ලබා දීමට හැකියාව ලැබී ඇති අතර පැමිණිලි 24 කට අදාල කාර්යයන් ක්‍රියාත්මක මට්ටමේ පවතී. එයින් ඉටු කළ නොහැකි පැමිණිලි සංඛ්‍යාව 11 ක් ලෙස හඳුනා ගෙන ඇත.

- **හදිසි ඇමතුම් සේවා සහ අනෙකුත් මහජන දුක්ගැනවිලි කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම**



අපරාධයක් සිදුවන අවස්ථාවකදී ඉක්මනින් ක්‍රියාත්මක වීම සඳහා පොලිස් ස්ථාන දැනුවත් කිරීමට අමාත්‍යාංශය යටතේ මෙන්ම ශ්‍රී ලංකා පොලීසිය යටතේ හදිසි ඇමතුම් සේවා දෙකක් ක්‍රියාත්මක කෙරේ. 118 හදිසි ඇමතුම් සේවාව අමාත්‍යාංශය මඟින් ද 119 හදිසි ඇමතුම් සේවාව ශ්‍රී ලංකා පොලීසිය මඟින් ද ක්‍රියාත්මක වන අතර ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ජනපතිට කියන්න ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකා පොලීසියට අදාළ යොමු කිරීම් අමාත්‍යාංශය මඟින් සිදු කෙරේ. පොලිස්පතිට කියන්න, පොලිස්පති මහජන සහන දිනය, මහජන සහන මැදිරිය ශ්‍රී ලංකා පොලීසිය මඟින් ක්‍රියාත්මක කරන අනෙකුත් මහජන දුක්ගැනවිලි කළමනාකරණ ක්‍රමවේද වේ.

එම ක්‍රමවේදයන් මඟින් 2017 වර්ෂය තුළ ලද හා විසඳූ පැමිණිලි සංඛ්‍යාව පහත සංඛ්‍යා වගුව මඟින් දැක්වේ.

**මහජන දුක්ගැනවිලි ලද හා විසඳූ සංඛ්‍යාව**

සංඛ්‍යා වගුව **- 11**

| අනු අංකය | කළමනාකරණ ක්‍රමවේදය | 2017 | | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | |
| 01 | 118 හදිසි ඇමතුම් | 40,936 | 40,936 | 100% |
| 02 | ජනපතිට කියන්න | 4,499 | 3,678 | 82% |
| 03 | පොලිස්පතිට කියන්න | 2,008 | 1,638 | 81% |
| 04 | පොලිස්පති මහජන සහන දිනය | 1,500 | 1,070 | 71% |
| 05 | මහජන සහන මැදිරිය | 1,566 | 1,158 | 74% |
| 06 | 119 හදිසි ඇමතුම් | 1,124,828 | 1,119,627 | 99% |
| | **එකතුව** | **1,175,337** | **1,168,107** | **99%** |

*මූලාශ්‍රය - 118 හදිසි ඇමතුම් අංශය හා ශ්‍රී ලංකා පොලීසිය*

118 ජාතික සේවා මැදිරිය වෙත ලැබෙන පැමිණිලි දිවයිනේ අදාල පොලිස් ස්ථාන වලට බැහැර කර එම තොරතුරු සම්බන්දයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව පැය 24 ක් තුළ පිළිතුරු ලබා ගැනීමට ක්‍රියා කිරීම විසඳූ පැමිණිලි ලෙස සැලකෙන අතර ජනපතිට කියන්න සේවා මැදිරියට ලද පැමිණිලි වලින් 13 ක් විමර්ශනය කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති අතර ඉතිරි පැමිණිලි 808 විමර්ශන මට්ටමේ පවතී.

## 2.2. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල කාර්යයභාරය කාර්යක්ෂම හා ඵලදායී කිරීමට අවශ්‍ය පියවර ගනිමින්

### 2.2.1. ශ්‍රී ලංකා පොලීසිය නව ආරකින් යුතුව මහජනතාව සමඟ සම්බන්ධ කරවීම





ශ්‍රී ලංකා පොලීසියේ තත්ත්කාලීනව පවත්නා අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන මහජන මිත්‍රශීලි පොලීසියක් ලෙස නිසි පරිදි යාවත්කාලීන කරමින් අනාගතයේ යහපත් සහ කාර්යක්ෂම පොලිස් සේවාවක් රට තුළ ස්ථාපිත කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට පිහිටවූ කමිටුව සකස් කළ පොලිස් ප්‍රතිසංවිධාන ක්‍රියාකාරී සැලැස්ම 2017.05.31 දින ගරු අමාත්‍යතුමා වෙත භාර දෙන ලදී. ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් නිර්දේශ පොලිස් ප්‍රතිසංවිධාන මෙහෙයුම් කමිටුව, ශ්‍රී ලංකා පොලීසිය තුළ ස්ථාපිත ප්‍රතිව්‍යුහ කළමනාකරණ දිසාව සහ පොලිස් ප්‍රතිසංවිධාන නියාමන ඒකකය යන ආයතන හරහා ක්‍රියාවට නංවනු ලබන අතර ඊට පොලිස් ප්‍රතිසංවිධානය පිළිබඳ අන්තර්ජාතික විශේෂඥ ශ්‍රීමත් හියු ඕඩ් මහතාගේ සහ නිශාන්ත කමලදාස මහතාගේ උපදේශකත්වය ලබා දෙයි. ඒ අනුව ශ්‍රීමත් හියු ඕඩ් මහතාගේ මෙරට පළමු සංචාරය 2017.10.23 – 27 යන දිනවලදී සිදු කරන ලදී. එසේම 2017.11.01 – 02 දින වලදී නිශාන්ත කමලදාස මහතාගේ සහ ස්කොට්ලන්ත පොලිස් නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමා, පොලිස්පතිතුමා සහ පොලිස් ප්‍රතිසංවිධාන මෙහෙයුම් කමිටුවේ මූලිකත්වයෙන් ප්‍රතිව්‍යුහ කළමනාකරණය හා සන්නිවේදන මූලෝපායන් පිළිබඳ වැඩමුළුවක් ටාජ්සමුද්‍රා හෝටලයේදී පවත්වන්නට යෙදුණි.

### 2.2.2. ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශේෂිත වූ විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීමට 2015 වර්ෂයේ යෝජනා විය. අමාත්‍යාංශය මඟින් පිහිටුවනු ලැබූ කමිටුවක් මඟින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අදාළව සැලසුම් සකස් කරනු ලබයි. ඒ අනුව පොලිස් නිලධාරීන් මෙන්ම ඊට සමගාමී වෘත්තියන්හි නියලෙන නිලධාරීන් ඇතුළු සිසුන් 500 ක් පමණ මෙම විශ්ව විද්‍යාලයට වාර්ෂිකව බඳවා ගැනීමට අපේක්ෂිතය. යෝජිත පොලිස් විශ්ව විද්‍යාලය පොලිස් සහ අපරාධ යුක්ති විශ්ව විද්‍යාලය ලෙස නම් කර තිබේ. මෙහිදී පොලිස් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, පොලිස් පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ඇතුළු මූලික උපාධි පාඨමාලාවන් මෙන්ම පශ්චාත් උපාධි ද හැදෑරීමට අවස්ථාව ලැබෙන අතර බ්‍රිතාන්‍ය නෝට්න්හැම්, ලිවර්පූල් මෙන්ම ඕස්ට්‍රේලියානු ඩීකින් විශ්ව විද්‍යාලයන්හි සහාය මේ සඳහා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. යෝජිත පොලිස් විශ්ව විද්‍යාලය සඳහා අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා පොලීසියට අයත් අක්කර 16 ක භූමියක් තෝරා ගෙන ඇති අතර විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාල පනත් කෙටුම්පත සකස්කර ඊට අදාල මූලික කටයුතු 2017 වර්ෂයේදී සිදු කරන ලදී.

### 2.2.3 පොලිස් නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට කටයුතු කරමින්

2016 අයවැය කතාවේදී පොලිස් සේවයේ වැටුප් විෂමතාවයන් විසඳීම අරමුණු කරගනිමින් හඳුනාගත් විෂමතා ප්‍රතිශතාත්මකව වර්ෂ කිහිපයකදී අවම කිරීම සඳහා රු.මි. 3,000 ක් වෙන් කරන ලදී. එම ප්‍රතිපාදන උපයෝජනය කරමින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නිලධාරීන්ගේ 2015.12.31 දින ලැබූ වැටුප් මත පදනම්ව මූලික වැටුපෙන් 17% ක දීමනාවක් 2016 වර්ෂය ආරම්භයේ සිට ගෙවීමට 2016.09.28 දින කටයුතු ආරම්භ කරන ලදී. අනතුරුව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව මඟින් පොලිස් නිලධාරීන් සඳහා 40% ක දීමනාවක් ලබා දීම නිර්දේශ කළ අතර 2017 වර්ෂයේ සිට තවදුරටත් 23% කින් වැටුප් වැඩි කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී.

### 2.2.4 ආබාධිත විශ්‍රාමික පොලිස් නිලධාරීන් සඳහා මෙතෙක් ගෙවා නොතිබූ දීමනා හා විශ්‍රාම වැටුප් ලබා දීමට කටයුතු කරමින්

ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව විශ්‍රාම ගන්වා ඇති පොලිස් නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 අනුව හිමිවිය යුතුව තිබූ නමුත් මෙතෙක් නොගෙවා ඇති දීමනා ලබා දීමට සහ 1988/1989 කාලයේ ඇතිවූ තත්ත්වයන් හේතුවෙන් ආබාධිතව විශ්‍රාම ගන්වා ඇති පොලිස් නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 59/89 පරිදි මෙතෙක් හිමි නොවූ වැටුප් හා දීමනා ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. ආබාධිත තත්ත්වයට පත් වන විට සේවා කාලය වසර 10 සපුරා නොමැති නිලධාරීන්ටද විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා සහ ආබාධිත හා මිය ගිය නිලධාරීන්ගේ උසස් වීම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිණ.

එසේම 1982 අංක 305 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීතිය හා සාමය ආරක්ෂා කිරීමේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මිය ගිය / සදාකාලික ආබාධිත වූ වයස අවුරුදු 55 දක්වා මාසික වැටුප් හා දීමනා ගෙවීම සක්‍රිය කර නොතිබූ නිලධාරීන් සඳහා එම වරප්‍රසාදය ලැබෙන පරිදි කටයුතු කළ අතර ආබාධිතව විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් සඳහා 2013.01.01 දින සිට රු.1,500 දිරි දීමනාවක් ගෙවීමට ද අනුමැතිය ලබා දෙන ලදී.

රාජ්‍ය සේවය වෙනුවෙන් සිය දිවි දෙවනි කොට සේවය කළ නිලධාරීන් සඳහා වන දුබලතා විශ්‍රාම වැටුප ආබාධ වූ දා සිට ගෙවීමට ද අනුමැතිය ඉල්ලා 2017.11.06 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අමාත්‍ය මණ්ඩල වෙත යොමු කිරීමට කටයුතු කර තිබේ.

### 2.2.5. ස්වයංක්‍රීය දඩපත් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම

දඩ මුදල් අයකර ගැනීම වේගවත් කිරීමත්, රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමත්, මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණු කරගනිමින් රථවාහන මාර්ග නීති උල්ලංඝනය වූ අවස්ථාවලදී උසාවියට ඉදිරිපත් නොකරන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා ලබාගන්නා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ස්ථාවර ප්‍රම්පාදන කමිටුවක් ස්ථාපිත කර ඇති අතර ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික අගැයීම් කමිටුවක් පත්කර තිබේ. ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හිමිකාරීත්වය යටතේ සිදු කිරීම සඳහා මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

## 2.3. දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණට ළඟා වීම සඳහා අවශ්‍ය පියවර ගනිමින්

- දක්ෂිණ කලාපයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් පරිපාලනය පිළිබඳ විශේෂ සාකච්ඡාවක් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධනය ගරු අමාත්‍යතුමා, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යතුමා, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්තුමා, ඉඩම්, වනජීවී, මහවැලි සහ නාගරික සංවර්ධන යන අමාත්‍යංශවල නිලධාරීන් ඇතුළු පිරිසකගේ ප්‍රධානත්වයෙන් 2017.08.18 දින අග්‍රාමාත්‍ය කාර්යාලයේදී පවත්වන ලදී.



- හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් ඵලදායී ලෙස භාවිතා කළ හැකි ආකාරය පිළිබඳ විමසා බැලීමේ අරමුණින් දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ පිළිබඳ සැලැස්මක් සකස් කිරීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධානත්වයෙන් සහ දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලයේ දායකත්වයෙන් 2017.09.29 සහ 30 යන දින වලදී තංගල්ලේදී වැඩමුළුවක් පවත්වන ලදී. ඒ සම්බන්ධ වාර්තාව 2017 වර්ෂය අවසාන වන විට සකස් කරමින් පැවතිණ.

- දක්ෂිණ කලාපය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් සකස් කරමින් පවතින අතර ඊට අදාලව ගාල්ල දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳ වැඩමුළුවක් 2017.08.22 දින ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූලිකත්වයෙන් පවත්වන්නට යෙදුණි. වැඩමුළුව සඳහා මෙම අමාත්‍යාංශය, දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලය, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ගාල්ල දිස්ත්‍රික්කයේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරීන් 100 කට අධික ප්‍රමාණයක් සහභාගී වී සක්‍රියව දායකත්වය ලබා දෙන ලදී.

## 2.4. ශ්‍රී ලංකා ජාත්‍යන්තර සහයෝගීතාවය

- සාර්ක් සංවිධානයට අයත් රටවල අභ්‍යන්තර/ස්වදේශ අමාත්‍යවරුන්ගේ 08 වන රැස්වීම සහ එයට පූර්වගාමීව පැවැත්වෙන සාර්ක් සංවිධානයට අයත් රටවල අභ්‍යන්තර/ස්වදේශ ලේකම්වරුන්ගේ 08 වන රැස්වීම, සාර්ක් සංවිධානයට අයත් රටවල ආගමන බලධාරීන්ගේ 08 වන රැස්වීම 2017.07.11 දින සිට 13 දක්වා ගාලුමුවදොර හෝටලයේ දී පැවැත්විණි. සාර්ක් සංවිධානයට අයත් රටවල අභ්‍යන්තර/ස්වදේශ කටයුතු භාර අමාත්‍යවරුන්ගේ 08 වන රැස්වීමේ සමාරම්භක උත්සවය ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ අතර එම අවස්ථාවට සාර්ක් කලාපීය රටවල් නියෝජනය කරමින් අදාළ විෂයභාර අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, මහකොමසාරිස්වරුන් ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී විය. එහිදී මත්ද්‍රව්‍ය ජාවාරම, මුදල් විශුද්ධිකරණය, මිනිස් ජාවාරම ඇතුළු කාලාපීය ගැටළු සම්බන්ධයෙන් අවධානය යොමු කෙරිණ.






- 2017.08.08 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති අග්නිදිග ආසියානු කලාපයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහ ජාත්‍යන්තර අපරාධ මැඩ පැවැත්වීම සම්බන්ධ වැඩමුළුවට නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමන් සහභාගී වෙමින්




- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමන් 2017.08.14 දින මහජන චීන සමුහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති යී ෂියැන්ලියැන්ග් මහතා ඇතුළු නියෝජිතයන් හමු විය. එහිදී දෙරට අතර සිදු කෙරෙන කටයුතු පිළිබඳ සාකච්ඡා කෙරිණ.



- 2017.08.22 දින මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධව තීරණාත්මක සිදුවීම් කළමනාකරණය සහ දුරස්ථ දූපත් සඳහා ප්‍රතිචාර දැක්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කලාපීය සමුළුව කොළඹදී පැවැත් වූ අතර ඒ සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍යතුමා සහ ලේකම්තුමා සහභාගී වෙමින් එම කටයුතු පිළිබඳ සාකච්ඡා කරන ලදී.



- දකුණු සහ අග්නිදිග ආසියානු කලාපීය බුද්ධි නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2017.09.14 දින කොළඹදී පැවති නීති විරෝධී සංක්‍රමණ, අවි ආයුධ ජාවාරම් හා දේශ සීමා ආරක්ෂාව පිළිබඳ වැඩමුළුවට නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ පොලිස්පතිතුමා ඇතුළු නිලධාරීන් සහභාගී වූ අතර එහිදී ශ්‍රී ලංකාවේ පවතින එකී ගැටළු සඳහා ජාත්‍යන්තර පොලිසියේ දායකත්වය ලබා ගැනීම සම්බන්ධ බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීම පිළිබඳ සාකච්ඡාවට භාජනය විය.



- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය සාගල රත්නායක මැතිතුමන් 2017.09.07 දින අරලියගහ මන්දිරයේදී බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් ජේම්ස් ඩවුරිස් මහතා සහ ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ උපදේශක සහ ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ ගෝලීය ආයතනයේ අධ්‍යක්ෂ රිචර්ඩ් වෝල්ටන් මහතා හමුවී සාකච්ඡා පවත්වමින්.



- ඉන්දිය කලාපීය රටවල උපාය මාර්ගිකව වැදගත් කරුණු සහ මුහුදු මාර්ගවල ආරක්ෂාව සම්බන්ධයෙන් 2017.08.31 දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පැවති ඉන්දීය සාගර සමුළුවට නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා සහභාගී වෙමින්.




## 2.5. අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රගතිය ඉහළ නැංවීමට පියවර ගනිමින්

### 2.5.1. අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම උදෙසා

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල විෂය භාර නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම හා ආයතන කටයුතු සම්බන්ධයෙන් දැනුම වර්ධනය කිරීම සඳහා 2017 ඔක්තෝම්බර් මස12 හා 13 දෙදින තුළ පුහුණු වැඩමුළුවක් පැවැත්විණ. මේ සඳහා නිලධාරීන් 150 දෙනෙකු සහභාගී වන ලදී. අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ මෙහෙයවීම යටතේ සිදු කරන ලද වැඩමුළුව සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී සහ මෙම අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) යන නිලධාරීන්ද සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

## 2.5.2. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතන සම්බන්ධ කර ගනිමින් පළමු, දෙවන, තෙවන හා සිව්වන කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. එමඟින් ආයතනයන්හි ඒවාට ආවේණික වූ ගැටළු හඳුනා ගැනීමටත් ඒ සඳහා අවශ්‍ය කඩිනම් විසඳුම් සෙවීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් ඒ අනුව ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමටත් හැකියාව ලැබුණි.



*ප්‍රගති සමාලෝචන රැස්වීමක අවස්ථාවක්*

## 2.5.3. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

2017 වර්ෂයේ විගණන සැලැස්මට අනුව පළමු, දෙවන, තෙවන හා සිව්වන කාර්තු සඳහා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වූ අතර 2015 සහ 2016 වර්ෂ වලට අදාළව රජයේ ගිණුම් කාරක සභාවට යොමු කළ යුතු ආයතන වල මූල්‍ය හා භෞතික කාර්ය සාධනයට අදාළ තොරතුරු නියමිත පරිදි යොමුකරන ලදී.

## 2.6. අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කාර්යය ප්‍රගතිය

- මෙරටට පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව සහ ඔවුන්ට ඇති වන ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසියට කඩිනමින් ක්‍රියාත්මක වීමට හැකි වන පරිදි සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා පොලීසියේ සංචාරක පොලිස් කොට්ඨාශය සඳහා බයිසිකල් 20 ක් සහ බීච් රෝවර් 04 ක් ලැබිණ. එම වාහන බෙදා දීම ගරු නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය සාගල රත්නායක මැතිතුමා සහ ගරු සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.12.26 වන දින කොළඹ නිදහස් චතුරශ්‍ර භූමියේදී සිදු විය.





- ශ්‍රී ලංකා රජය විසින් දියත් කර ඇති මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2017 – 2021 යටතේ ආංශික කමිටු 10 ක් පිහිටුවා ඇති අතර ඉන් වධ හිංසා වැළැක්වීමට අදාල සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආංශික කමිටුව මෙම අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන්, අතිරේක ලේකම් (II), ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (II) සහ ඊට අදාල සියළු පාර්ශවකාර ආයතන වල සහභාගීත්වය සහිතව ක්‍රියාත්මක වේ. ජාතික සැලැස්මේ වධ හිංසා වැළැක්වීමට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ප්‍රගතිය වාර්තා කිරීම මෙම කමිටුව මඟින් සිදු කරනු ලබයි.

- 2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය දීම හා ආරක්ෂා කිරීමේ පනතේ නීතිමය ප්‍රතිපාදනයන්ට අනුව අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පාලක කමිටු සාමාජිකාවක් ලෙස අමාත්‍යාංශ අතිරේක ලේකම් (I) නියෝජනය කිරීම.

- අමාත්‍යාංශය නියෝජනය කරමින් අතිරේක ලේකම් (I) ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ මූල්‍ය දායකත්වය යටතේ මෙහෙයවන අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නොවන පරිදි බන්ධනාගාර රැඳවියන් ප්‍රමාණය ඉක්මවමින් අතිවාස වීම අවම කිරීම පිළිබඳ පාර්ශව සහභාගීත්ව කමිටුවේ සාමාජිකාවක් ලෙස කටයුතු කිරීම.

- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම යන මැයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පැවැත්වෙන ආංශික අධීක්ෂණ අනුකමිටු සාමාජිකාවක ලෙස ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් අමාත්‍යාංශ අතිරේක ලේකම් (I) සහභාගී වීම.

- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන විසින් මෙහෙයවන වැඩසටහන් සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් අතිරේක ලේකම් (I) සම්බන්ධීකරණ නිලධාරිනියක වශයෙන් සක්‍රීය දායකත්වය ලබා දීම.

- ශ්‍රී ලංකාවේ ජී.එස්.පී. ප්ලස් තීරුබදු සහන ක්‍රියාවලියට අදාල මෙහෙයුම් යාන්ත්‍රණය අධීක්ෂණය කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් විෂය පථ හතරක් ඔස්සේ අධීක්ෂණ කණ්ඩායම් හතරක් පිහිටුවා කටයුතු කරනු ලබයි. එම අධීක්ෂණ කණ්ඩායම් හතරින් යහපාලනයට අදාල කණ්ඩායමේ (මත්ද්‍රව්‍ය ජාවාරම් සහ දූෂණ විරෝධී කණ්ඩායම) කණ්ඩායම් ප්‍රධානියා ලෙසත් මානව අයිතිවාසිකම් කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙසත් අමාත්‍යාංශ අතිරේක ලේකම් (II) කටයුතු කරනු ලබයි. ඒ යටතේ එක් එක් කණ්ඩායමට අදාල විෂය පථයන් ඔස්සේ තොරතුරු රැස් කිරීම යාවත්කාලීන කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබේ.

- සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය මඟින් ඉදිරිපත් කර ඇති මෙම අමාත්‍යාංශය යටතට ගැනෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය අග්‍රාමාත්‍ය කාර්යාලයට වාර්තා කිරීමේ කාර්යය සම්බන්ධීකරණය කිරීම අතිරේක ලේකම් (II) යටතේ සිදු කිරීම.

- විදේශ කටයුතු අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය සහිතව ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මිනිස් ජාවාරම් පිළිබඳ සාකච්ඡාව සඳහා අතිරේක ලේකම් (II) පාර්ශවකරුවෙකු ලෙස සහභාගී වීම.

- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කෙරෙන රාජ්‍ය සැපයුම් පද්ධතියේ පාර්ශවකරුවකු වශයෙන් අතිරේක ලේකම් (II) සහභාගී වීම.

- එක්සත් ජාතීන්ගේ කාර්යාලය හා විදේශ කටයුතු අමාත්‍යාංශය සම්බන්ධීකරණය යටතේ ක්‍රියාත්මක වන සාමය ගොඩනැගීමේ ආංශික අධීක්ෂණ කමිටු සාමාජිකයෙකු ලෙස අතිරේක ලේකම් (II) අමාත්‍යාංශය නියෝජනය කිරීම.

- මෙම අමාත්‍යාංශයේ සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය අනුග්‍රාහකත්වය ඇතිව මෙම අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල නිලධාරීන් සඳහා විවිධ තේමාවන් ඔස්සේ වැඩසටහන් 04 ක් සිදුකරන ලදී. එම වැඩසටහන් පිළිබඳ විස්තර පහත වගුව මඟින් දැක්වේ.

**පැවැත්වූ වැඩසටහන් පිළිබඳ විස්තර**

**සංඛ්‍යා වගුව - 12**

| වැඩසටහනේ නම | ක්‍රියාත්මක කළ දිනය | සම්පත් දායකත්වය | සහභාගීත්වය |
|---|---|---|---|
| ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ආකල්ප හේතුවෙන් කාන්තාව මුහුණපාන ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 2017.04.27 | ඉන්දික දයාරත්න මහතා - ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටු දැකීමේලා ස්වාධීන පුරුෂ දායකත්වය පිළිබඳ පුහුණු උපදේශක හා ප්‍රජා සංවර්ධන උපදේශක | නිලධාරීන් 93 |
| කාන්තා ගෘහ මූලික පවුල් සඳහා වන ජාතික සැලැස්ම සකස් කිරීමට අදාල සාකච්ඡාව | 2017.05.30 | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන ) සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ප්‍රධානත්වයෙන් | නිලධාරීන් 17 |
| සේවා ස්ථානයේදී සිදුවන ලිංගික හිරිහැර පිටු දැකීමේ ප්‍රතිපත්ති මාලාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන | 2017.09.29 | ▪ මේනකා හේරත් මහත්මිය - අධ්‍යක්ෂ (අධ්‍යාපන හා විශේෂ වැඩ සටහන් ) මානව හිමිකම් කොමිසන් සභාව<br>▪ එම්.ඒ.එන් චන්ද්‍රසිරි මහතා - වැඩ බලන අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) මානව හිමිකම් කොමිසන් සභාව | නිලධාරීන් 97 |
| සේවා ස්ථානයේදී සිදුවන ලිංගික හිරිහැර පිටු දැකීමේ ප්‍රතිපත්ති මාලාවට අනුව ලිංගික හිරිහැර විමර්ශන කමිටුව ස්ථාපිත කොට බලාත්මක කිරීමේ වැඩසටහන | 2017.12.26 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන ) ගේ ප්‍රධානත්වයෙන් | නිලධාරීන් 65 |

*මූලාශ්‍රය- අමාත්‍යාංශ පාලන අංශය*

- අභ්‍යන්තර කටයුතු සහ වයඹ සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන ආගමන විගමන දෙපාර්තමේන්තුව යටතේ සිදුකරනු ලබන ප්‍රත්‍යන්ත කළමනාකරණ කමිටු සාමාජිකයෙකු ලෙස නීතිය හා සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (I) කටයුතු කිරීම.

- කොළඹ නගරය හා ඒ අවට ප්‍රදේශවල අලංකරණය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය දියත් කරන ලද වැඩසටහන සඳහා අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (I) අමාත්‍යාංශය නියෝජනය කරමින් සහභාගි වීම.

- රථ වාහන හා මාර්ග නීති උල්ලංඝනය වූ අවස්ථාවලදී ශ්‍රී ලංකා පොලීසිය මඟින් ක්ෂණික දඩ මුදල් එකතු කිරීමේ ක්‍රමවේදය සඳහා පුළුල් විද්‍යුත් විසඳුමක් ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය සමඟ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (I) සම්බන්ධව කටයුතු කිරීම.

- පොලිස් නිලධාරීන්ගෙන් අයවිය යුතු, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමෙහි හිඟ ශේෂ අයකර ගැනීමේ කමිටු සාමාජිකයෙක් ලෙස ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (I) කටයුතු කිරීම.

- මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සමඟින් සම සභාපතිත්වය දරන යුරෝපා සංගමය යටතේ එන "ස්විච් ඒෂියා" ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන "ශ්‍රී ලංකාවේ තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට සහාය වීම" යන වැඩසටහන මඟින් "හරිත ගම්මාන" සංකල්පයේ වැදගත්කම රටට හඳුන්වා දීමේ කාර්යයෙහි මෙම අමාත්‍යාංශයේ කමිටු සාමාජිකාව ලෙස අධ්‍යක්ෂ සැලසුම් කටයුතු කරනු ලබයි.



## 2.7. අධීක්ෂණය කරන ලද සංවර්ධන ව්‍යාපෘති වල කාර්යසාධනය

- පොලිස් හා විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ නේවාසික පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සපුරාලීම පිණිස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද පෙරසවි නිවාස ව්‍යාපෘතිය මඟින් 2017 වර්ෂය අවසාන වනවිට ශ්‍රී ලංකා පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ ගොඩනැගිලි පිළිවෙලින් 514 ක් හා 186 ක් ඉදිකර අවසන් කර ඇත. 2017 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා පොලීසියේ ඉදිකරමින් පැවති ගොඩනැගිලි ප්‍රමාණය 05 කි. විශේෂ කාර්ය බලකායේ ගොඩනැගිලි ඉදිකර අවසන් නමුදු අනෙකුත් කාර්යයන් ක්‍රියාත්මක මට්ටමේ පවතින ගොඩනැගිලි 34 කි. භෞතික ප්‍රගතිය එසේ වුවද අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2017 වර්ෂයට ශ්‍රී ලංකා පොලීසියට වෙන්වූ රුපියල් මිලියන 313 ක ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 301.27 ක් සහ විශේෂ කාර්ය බලකායට වෙන්වූ රුපියල් මිලියන 175 ක ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 167.9 ක වැය දරා තිබුණි.





*ඉදි කරන ලද පෙරසවි නිවාස වල දර්ශන*

- පොලිස් නිලධාරීන් වෘත්තීයමය වශයෙන් සංවර්ධනය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් නංවාලීම පිණිස කටාන පොලිස් අභ්‍යාස විද්‍යාලය සංවර්ධනය සඳහා 2017 වසරට වෙන් වූ ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 11.17 ක් වැය කර තිබේ.

- ශ්‍රී ලංකා පොලීසියට බඳවා ගන්නා නවක නිලධාරීන් සඳහා මූලික පුහුණුවීම් කළුතර පොලිස් විද්‍යාලය මඟින් සිදු කරන අතර එම විද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා 2017 වර්ෂයේ රුපියල් මිලියන 93.3 ක් වැයකරන ලදී.

- අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා පොලීසියේ ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා රුපියල් මිලියන 1,037 ක් වැයකරමින් නව පොලිස් ගොඩනැගිලි 08 ක් ඉදිකිරීමට කටයුතු කරන ලද අතර වර්ෂය අවසාන වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පැවති මුළු ගොඩනැගිලි ගණන 30 කි.



*ඉදි කළ මළලසේකර මාවත කාන්තා භට නිවාසය*

- විශේෂ කාර්ය බලකායේ පවතින ගොඩනැගිලි ගැටළුවට විසඳුම් ලබා දෙමින් ඉදිකිරීමට සැලසුම් කරන ලද ව්‍යාපෘති අතරින් 2017 වර්ෂයට වෙන්වූ රුපියල් මිලියන 325 ක ප්‍රතිපාදන උපයෝගී කර ගෙන රුපියල් මිලියන 296.64 ක් වැයකර ගොඩනැගිලි 43 ක වැඩ 2017 වසරේ නිම කර ඇති අතර ව්‍යාපෘති 17 ක්‍රියාත්මක මට්ටමේ පවතීයි.



*බුත්තල කඳවුරේ රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ නිවස්නය*

- ශ්‍රී ලංකා පොලීසිය සඳහා පැවරී ඇති කාර්යයක් වන රථවාහන ගමනාගමන පාලනය පහසු කරගනුවස් අශ්වයින් 18 ක් සහ අපරාධ විමර්ශන කටයුතු පහසු කර ගැනීමේ අරමුණින් සුනඛයින් 50 ක් මිලදී ගැනීම සඳහා වන මූලික ප්‍රසම්පාදන කටයුතු 2017 වර්ෂය තුළදී ආරම්භ කරන ලදී.

- විශේෂ කාර්ය බලකායට අයත් ගාල්ල, දඹුල්ල සහ හම්බන්තොට කඳවුරු වල බැරැක්ක ඉදි කිරීම සඳහා 2017 වර්ෂයේ ශ්‍රී ලංකා පොලීසියට වෙන්වූ රුපියල් මිලියන 100 ක් ලබාදුන් අතර ඉන් රුපියල් මිලියන 25.5 ක වියදමක් දරා අදාල ඉදිකිරීම් වලින් 25% කින් අවසන් කර තිබේ.

- ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් ස්ථාන සංඛ්‍යාව 600 දක්වා ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්වූ රුපියල් මිලියන 500 ක ප්‍රතිපාදන 2017 වර්ෂය තුළදී පහත සඳහන් පොලිස් ස්ථාන වලට අදාළ ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම නිමකර රාජකාරී කටයුතු සඳහා විවෘත කරන ලදී.

**වැඩ නිමකළ පොලිස් ස්ථාන**

**සංඛ්‍යා වගුව - 13**

| # | පොලිස් ස්ථානයේ නම | පොලිස් ස්ථාන අංකය | විවෘත කළ දිනය | පොලිස් අධිකාරී කොට්ඨාශය |
|---|---|---|---|---|
| 1 | යක්කල | 473 | 2017.01.23 | ගම්පහ |
| 2 | පල්ලේවෙල | 474 | 2017.01.23 | ගම්පහ |
| 3 | ගොතටුව | 475 | 2017.01.27 | නුගේගොඩ |
| 4 | ඉමදූව | 476 | 2017.02.10 | ගාල්ල |
| 5 | බටපොල | 477 | 2017.02.10 | ඇල්පිටිය |
| 6 | හල්දුම්මුල්ල | 478 | 2017.04.22 | බණ්ඩාරවෙල |
| 7 | අඹගස්දෝව | 479 | 2017.04.22 | බණ්ඩාරවෙල |
| 8 | බෝගහකුඹුර | 480 | 2017.04.22 | බණ්ඩාරවෙල |
| 9 | පරසන්ගස්වැව | 481 | 2017.06.07 | අනුරාධපුර |
| 10 | මොරගොඩ | 482 | 2017.07.15 | අනුරාධපුර |
| 11 | උඩප්පුව | 483 | 2017.07.15 | පුත්තලම |
| 12 | ආරච්චිකට්ටුව | 484 | 2017.07.15 | හලාවත |
| 13 | එගොඩඋයන | 485 | 2017.08.29 | ගල්කිස්ස |
| 14 | මීපේ | 486 | 2017.08.29 | නුගේගොඩ |
| 15 | අගලවත්ත | 487 | 2017.10.23 | කළුතර |
| 16 | දුග්ගල්පිටිය | 488 | 2017.10.27 | මීගමුව |
| 17 | වරකාගොඩ | 489 | 2017.11.24 | කළුතර |

*මූලාශ්‍රය- ශ්‍රී ලංකා පොලීසිය*

- ශ්‍රී ලංකා පොලීසියේ තොරතුරු හා සන්නිවේදන පද්ධතිය සංවර්ධනය කිරීමත්, නවීන තොරතුරු තාක්ෂණය පොලීසිය වෙත හඳුන්වාදීමත් අරමුණු කරගනිමින් අරඹන ලද පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධති ව්‍යාපෘතියේ මූලික පදනම වන සංඛ්‍යාත පරාසයන් ලබා ගැනීම සඳහා 2017 ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 92.5 ක් දරන ලදී. එසේම වසර කිහිපයකට ඉහතදී ආරම්භ කරන ලද පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධති ව්‍යාපෘතිය නව තාක්ෂණය හා ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍යතා අනුව සමාලෝචනය කර 2018 – 2024 වර්ෂ තුළ අදියර දෙකක් යටතේ ආරම්භ කිරීමට අපේක්ෂා කරමින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සංකල්ප වාර්තාවට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගන්නා ලදී. එසේම එම ව්‍යාපෘතියේ පළමු අදියර බස්නාහිර පළාත ආවරණය කරමින් 2018 – 2020 කාලය තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වන සේ 2017.10.10 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

- 2017 අයවැය යෝජනා මඟින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා පොලීසියට සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කරමින් සිදු කරන ලද වැඩසටහන් සඳහා ආයතන දෙක පිළිවෙලින් රුපියල් මිලියන 25 සහ රුපියල් මිලියන 7.2 බැගින් වර්ෂය තුළදී වියදම් දරණ ලදී.

- 2017 වර්ෂය තුළ දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය සඳහා 2017 අයවැය යෝජනා මඟින් වෙන්කළ රු. මි. 1,000 ක ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ගාල්ල, මාතර, හම්බන්තොට,

මොණරාගල හා රත්නපුර යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 724 ක ප්‍රගතිය පහත වගු අංක 12 මඟින් දැක්වේ.

**දක්ෂිණ ප්‍රදේශය සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 14**

| දිස්ත්‍රික්කය | වෙන් කළ ප්‍රතිපාදන (රු. මි.) | අනුමත කළ ව්‍යාපෘති ගණන | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | අවිච්ඡේද ව්‍යාපෘති ගණන | ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|---|
| ගාල්ල | 69.6 | 25 | 20.5 | 1 | - |
| මාතර | 719.5 | 552 | 73.1 | 31 | 75 |
| හම්බන්තොට | 118.6 | 60 | 66.7 | 1 | 5 |
| මොණරාගල | 68.9 | 55 | 46.1 | 1 | 1 |
| රත්නපුර | 23.4 | 32 | 6.1 | 1 | 1 |
| එකතුව | 1,000 | 724 | 212.5 | 35 | 82 |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ සැලසුම් අංශය*





- දෙස් විදෙස් සංචාරකයින් ආකර්ශනය වන කලාපයක් ලෙස හඳුනාගෙන ඇති දෙද්දුව කලාපය සංචාරක පාරාදීසයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එම ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රදේශයෙන් වැඩි බිම් ප්‍රමාණයක් ජලාශ්‍රිත ඉඩම් ලෙස හඳුනාගෙන ඇති බැවින් එහි ඉදිකිරීම් හා අනෙකුත් සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් යෝග්‍යතාවය මැනීමට අවශ්‍ය පරීක්ෂණ සිදු කරමින් පවතී. ඒවායින් හයිඩ්‍රොලික් පරීක්ෂණ (ද්‍රව විද්‍යා පරීක්ෂණ) 2017 වර්ෂයේ සිදු කරන ලදී.

- යාල අභය භූමිය තුළ පිහිටි දැනට අබලන්ව පවතින අතුරු මිතුරු වැවෙහි වේල්ල වනජීවී දෙපාර්තමේන්තුවේ සහයෙන් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇති අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය මිනුම් කටයුතු අවසන් කිරීමෙන් පසු ඉදිරි වසර තුළ එම ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතය.

- දක්ෂිණ කලාපයේ නගර ක්‍රමවත් ආකාරයට සංවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කිරීමට යෝජිත සැලසුම් අනුව දෙනියාය නගර සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා මූලික සැලසුම් සකස් කර අවසන් කර ඇත. ඒ යටතේ දෙනියාය ප්‍රාදේශීය රෝහල මහ රෝහලක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන පාංශු පරීක්ෂාවක් සිදු කළ අතර ඉදිරි වසර තුළ එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිතය.

- දක්ෂිණ සංවර්ධන මණ්ඩලය, වන ජීවී දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය එක්ව යාල අභය භූමිය පවත්වාගෙන යාමේදී පවතින ගැටළු නිරාකරණය කිරීම සම්බන්ධයෙන් පත්‍රිකාවක් ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව වෙත යොමු කළ අතර ඒ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස නිර්දේශ ලැබී ඇත. එමෙන්ම බුන්දල හා කලමැටිය වැනි ස්ථාන වල පවතින පාරිසරික දූෂණය වළක්වා ගනිමින් ජෛව විවිධත්වය රැකගනිමින් එම ප්‍රදේශ සංරක්ෂණය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී.

- දක්ෂිණ කලාපය සංවර්ධන වැඩසටහන් යටතේ එම කලාපය තුළ ආයෝජන, කර්මාන්ත, සංචාරක කලාප පිහිටුවීමට කටයුතු කරමින් සිටියි. ඒ තුළ හම්බන්තොට ආයෝජන කර්මාන්ත කලාපය සඳහා අක්කර 2,000 ක ඉඩම් ප්‍රමාණයක් ද මොණරාගල කර්මාන්ත කලාපය සඳහා අක්කර 4,000 ක ඉඩම් ප්‍රමාණයක්ද රටලංකාවත්ත කාර්මික පුහුණු මධ්‍යස්ථානය ව්‍යාපෘතිය සඳහා සුදුසු ඉඩමක්ද හඳුනාගෙන ඇති අතර හික්කඩුව අකුරළ ප්‍රදේශයේ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය, පැරණි ඕලන්ද ඇළ මාර්ගයක් වන ලංකා ඇළ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් හඳුනා ගනිමින් පවතී. ඒ අනුව අවශ්‍ය ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු ක්‍රියාත්මක කෙරේ.



- තංගල්ල බන්ධනාගාරය අඟුණකොළපැලැස්සට විතැන් කිරීමෙන් අනතුරුව තංගල්ල බන්ධනාගාරය පැවති භූමි ප්‍රදේශයෙහි සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහාත් බෙන්තොට ගඟ වඩාත් ආකර්ශනීය ලෙස දේශීය නැඹුරුතාවයකින් යුතු සංස්කෘතික අගනාකම් එක් කරමින් සංචාරක ආගමනය ඉහළ නැංවීමටත් අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී.

- **ගාල්ල කොටුවේ විදුලි ලාම්පු ප්‍රතිසංස්කරණය කිරීම**

  ගාල්ල කොටුවේ බිත්ති මත පැරණි හැඩයට සකස් කර සවිකරනු ලැබූ ලාම්පු එහි පෞරාණිකත්වය වර්ධනය කරන සුවිශේෂී අංගයකි. එම ලාම්පු පද්ධතිය නවීකරණය කිරීම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය මඟින් සිදු කරමින් පවතී. ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 4.2 කි. 2017 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු 60% නිමා කර ඒ සඳහා රුපියල් මිලියන 0.89 ක වියදමක් දරා ඇති අතර විදුලි කේබල් අළුත්වැඩියා කර 2018 වර්ෂය තුළදී සියළු කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.






- **ගාල්ල කොටුවේ උසාවි චතුරශ්‍රයේ විදුලි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම**

ගාල්ල කොටුවේ පිහිටි උසාවි සංකීර්ණය ඉදිරිපිට ඇති විවෘත චතුරශ්‍රයේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කරමින් එම ස්ථානය විවිධ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම සඳහා සුදුසු පරිදි සකස් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 0.23 ක වියදමක් දරා 35% ක කාර්ය ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී.





# 03. ආංශීය කාර්ය සාධනය

## 3.1. පාලන අංශය

අමාත්‍යාංශයේ සියළුම ආයතනික සහ අභ්‍යන්තර පරිපාලන කටයුතු පාලන අංශය මඟින් සිදුකරනු ලබයි.

- වර්ෂය තුළදී සංඛ්‍යා වගු අංක 13 පරිදි අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් සිදු වූ අතර ඊට අදාළව සිදු කළ යුතු කටයුතු පාලන අංශය මඟින් සිදු කරන ලදී.

**කාර්ය මණ්ඩල වෙනස්වීම් - 2017**

සංඛ්‍යා වගුව **- 15**

| අනු අංක | තනතුර | සේවය | අනුමත සේවක සංඛ්‍යාව | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් | විශ්‍රාම ගිය නිලධාරීන් | ඉල්ලා අස්වූ නිලධාරීන් | ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් |
|---|---|---|---|---|---|---|---|
| 1 | ලේකම් | | 01 | 01 | - | - | 01 |
| 2 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී.ලං.ග.සේ | 01 | - | - | - | 01 |
| 3 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | 03 | 01 | - | - | 01 |
| 4 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | 01 | - | 01 | - | |
| 5 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | 03 | - | - | - | 01 |
| 6 | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | 01 | 01 | - | - | - |
| 7 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | 40 | 01 | - | 01 | - |
| 8 | රියදුරු | රි.සේ. | 15 | 01 | - | - | - |
| 9 | කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ. | 18 | 01 | - | - | - |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ පාලන අංශය*

- කාර්ය මණ්ඩලයේ දැනුම, තාක්ෂණික හැකියාව සහ භාෂා ප්‍රවීණතාවය වර්ධනය කිරීම අරමුණු කරගෙන දේශීය පුහුණු පාඨමාලා 24 ක් සඳහා 2017 වර්ෂයේ නිලධාරීන් 343 දෙනෙකු යොමු කරන ලදී.

**දේශීය පුහුණු**

**සංඛ්‍යා වගුව - 16**

| පුහුණු පාඨමාලාව | යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රවාහන කළමනාකරණය | 01 |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම | 03 |
| පරිගණකගත රජයේ ගිණුම්කරණ පද්ධතිය පිළිබඳ පුහුණුව (සීගාස්) | 04 |
| රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 01 |
| පරිගණකගත රජයේ ගෙවීම් පද්ධතිය පිළිබඳ පුහුණුව | 04 |
| කාර්යාල පරිපාලනය, ලිපි ගොණු කළමනාකරණය සහ ආයතන සංග්‍රහය පිළිබඳ පුහුණුව | 01 |
| රැකියා අවශ්‍යතා සඳහා ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| ජනමාධ්‍ය භාවිතය පිළිබඳ වැඩමුළුව | 01 |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 02 |
| පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| ව්‍යාපෘති යෝජනා සැකසීමේ වැඩමුළුව | 02 |
| ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | 02 |
| රාජ්‍ය අංශයේ රැකවරණ නිලධාරීන් සඳහා වන සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| ගිණුම් හා ආයතන කටයුතු පිළිබඳ පාඨමාලාව | 150 |
| කථන පුහුණුව | 01 |
| මාධ්‍ය පුහුණුව | 01 |
| දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 60 |
| ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| ඵලදායිතා පුහුණු සහතික පත්‍ර පාඨමාලාව | 03 |
| මාණ්ඩලික නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන වැඩසටහන | 17 |
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ ධාරිතා වැඩසටහන | 01 |
| ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරීන්ගේ ධාරිතා වැඩසටහන | 01 |
| ඵලදායිතා පුහුණු වැඩමුළුව | 142 |
| බැහැරගත ක්‍රියා විධි පුහුණුව | 92 |
| **එකතුව** | **493** |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ පාලන අංශය*

- 2017 වර්ෂය තුළ අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 13 දෙනෙකු විදෙස් පුහුණු සහ සමුළු 12 ක් සඳහා සහභාගී වී ඇති අතර ඒ පිළිබඳ තොරතුරු පහත වගු අංක 17 මඟින් දැක්වේ.

## අමාත්‍යාංශයීය මාණ්ඩලික නිලධාරීන්ගේ විදේශීය පුහුණු පිළිබඳ විස්තර

**සංඛ්‍යා වගුව - 17**

| # | නිලධාරියාගේ නම | තනතුර | රට | පුහුණු පාඨමාලාව / සමුළුව | දින ගණන |
|---|---|---|---|---|---|
| 01 | ජගත් පී. විජේවීර මහතා | ලේකම් | චීනය | ශ්‍රී ලංකාව නියෝජනය කරමින් දූත මණ්ඩල චාරිකාවක් සඳහා | 07 |
| 02 | ඒ.එල්.එම්. සලීම් මහතා | අතිරේක ලේකම් | | | |
| 03 | ඩී.බී.විජේමාන්න මහතා | ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | | | |
| 04 | විජිතා සෙනෙවිරත්න මිය | අතිරේක ලේකම් | චීනය | ජනගහනය, තිරසාර සංවර්ධනය සහ දිළිඳුකම අවම කිරීම පිළිබඳ වැඩමුළුව 2017 | 21 |
| 05 | | | තායිලන්තය | මාර්ග අනතුරු වැළැක්වීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කඩිනම් කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු - නැගෙනහිර ආසියා කලාපයේ අමාත්‍යවරුන්ගේ රැස්වීම | 03 |
| 06 | නිශාන්ත වීරසිංහ මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | කැනඩාව | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 03 |
| 07 | වී.කේ.එච්.කෝලිත මහතා | ප්‍රධාන ගණකාධිකාරී | චීනය | මූල්‍ය කළමනාකරණය සහ ශුන්‍ය පාදක අයවැය ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව 2017 | 21 |
| 08 | | | මැලේසියාව | ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ I වන පන්තියේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය පුහුණු වැඩමුළුව | 07 |
| 09 | | | එංගලන්තය | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය | 11 |
| 10 | රත්නා එදිරිසිංහ මිය | අධ්‍යක්ෂ සැලසුම් | චීනය | ආර්ථික සංවර්ධනය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව 2017 | 21 |
| 11 | ඩී.එස්.සමරවික්‍රම මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | චීනය | චීන ශ්‍රී ලංකා ව්‍යාපෘති අභිවර්ධන වැඩසටහන | 14 |
| 12 | කේ.ඒ.බී. කුරුප්පු මහතා | ගණකාධිකාරී | චීනය | චීන ශ්‍රී ලංකා ව්‍යාපෘති අභිවර්ධන වැඩසටහන | 14 |
| 13 | | | එංගලන්තය | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය | 11 |
| 14 | කේ.කේ.එස්.ලක්මිණි මෙය | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | චීනය | සයිබර් අපරාධ මැඩලීම පිළිබඳ වැඩමුළුව 2017 | 21 |
| 15 | ජේ.එම්.ඊ.ලක්මිණි මිය | ගණකාධිකාරී | චීනය | සයිබර් අපරාධ මැඩලීම පිළිබඳ වැඩමුළුව 2017 | 21 |
| 16 | ඖෂධ ගුණතිලක මහතා | සහකාර ලේකම් | හොංකොං | කළමනාකරණය පිළිබඳ අන්තර්ජාතික වැඩසටහන | 08 |
| 17 | ඩී.එම්.සී.කේ. දිසානායක මිය | පරිපාලන නිලධාරී | මැලේසියාව | කාන්තා නායකත්වය උදෙසා වෘත්තීය පරිවර්තනය පිළිබඳ අන්තර්ජාතික වැඩසටහන | 08 |

*මූලාශ්‍රය- පාලන අංශය*

- ආයතන හා පරිපාලන කටයුතුවලට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 13 ක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අදාළ කටයුතු සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගෙන තිබේ.

- අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මඟින් මෙම අමාත්‍යාංශය සඳහා පුද්ගල අනන්‍යතාවය සඳහා වූ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ (සුහුරුපාය) 14 වන මහළ ලබා ගෙන 2017 ජනවාරි මාසයේ අමාත්‍යාංශය එම ස්ථානය ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වල ආයතනික සහ පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් දායක වීම.

    - ශ්‍රී ලංකා පොලිසියේ හා විශේෂ කාර්ය බලකායේ සියළුම වර්ගයේ අලාභ හානි වලට අදාලව ලැබී තිබූ ගොණු 679 ක් සහ වන්දි ගෙවීම් සම්බන්ධ ගොණු 454 ක් සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලදී.

    - ශ්‍රී ලංකා පොලිසියේ හා විශේෂ කාර්ය බලකායේ ගොඩනැගිලි කුලියට ගැනීම් සම්බන්ධ මු.රෙ. 115 සහ මු.රෙ.835 වලට අදාල ගෙවීම් 224 ක් සඳහා අනුමැතිය ලබා දීම.

    - තොරතුරු පනතට අදාලව ඉල්ලීම් 18 ක් ලැබී තිබූ අතර ඉන් 17 ක් සඳහා තොරතුරු ලබා දී එක් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන ලදී.

    - ශ්‍රී ලංකා පොලිසියේ සිවිල් කාර්ය මණ්ඩලයේ පත්වීම් ස්ථිර කිරීම් 63 ක්, උසස් කිරීම් 235 විශ්‍රාම ගැන්වීම් 439 ක් සහ ප්‍රායෝගික පුහුණු සඳහා අභ්‍යාසලාභීන් යොමු කිරීම් 54 ක්, වර්ෂය තුළදී සිදු කළ අතර විනය කටයුතු සම්බන්ධ ගොණු 82 ට අදාලව අවශ්‍ය කටයුතු සිදු කිරීම.

    - ශ්‍රී ලංකා පොලිසියේ හා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්ගේ විදේශ නිවාඩු ඉල්ලීම් 583ක් සඳහා අනුමැතිය ලබා දුණි.

- අමාත්‍යාංශයේ කටයුතු කාර්යක්ෂම ලෙසින් හා මහජන හිතකාමී ස්ථානයක් ලෙස පවත්වාගෙන යාම අරමුණු කර ගෙන අමාත්‍යාංශයට අවශ්‍ය වන කාර්යාලීය උපකරණ සහ ලී බඩු මිලදී ගැනීම සම්බන්ධ රාජකාරී කටයුතු ද, කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම හා මනා ලෙස පවත්වාගෙන යාමද, ජල බිල්පත්, විදුලි බිල්පත් හා කාර්යාල කුලී නිරවුල් කිරීම සම්බන්ධ කටයුතු ද පරිගණක ඡායාපිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වාහන ආදියෙහි අළුත්වැඩියා සහ සේවා කටයුතු ද සිදු කිරීම.

## 3.2. පොලිස් අංශය

- අමාත්‍යාංශ අනුමත බල අධිකාරී සීමාවට අයත් ශ්‍රී ලංකා පොලීසියේ තනතුරු උසස්වීම් ලබා දීම යටතේ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුරට නිලධාරීන් 43 දෙනෙකුට ද සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට පොලිස් අධිකාරී තනතුරට නිලධාරීන් 24 දෙනෙකුට ද කාන්තා සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට කාන්තා පොලිස් අධිකාරී තනතුරට නිලධාරීන් 08 දෙනෙකුට ද පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට නිලධාරීන් 03 කටද ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරේ සිට නියෝජ්‍ය පොලිස්පති තනතුරට නිලධාරින් 26 දෙනෙකුට ද නියෝජ්‍ය පොලිස්පති තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට නිලධාරීන් 02 දෙනෙකුටද උසස්වීම් ලබා දීමට කටයුතු කර ඇත. වසර තුළ උසස්වීම් පෙරදාතම කිරීම 25 ක් අනුමැතිය සඳහා ජාතික පොලිස් කොමිසම වෙත යොමු කිරීමටද කටයුතු කර ඇත.

- අමාත්‍යාංශ අනුමත බල අධිකාරී සීමාවන්ට අයත් විශේෂ කාර්ය බලකායේ සහ ශ්‍රී ලංකා පොලීසියේ රාජ්‍ය නිවේදිත නිලධාරීන් 50 දෙනෙකුට සේවය ස්ථිර කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර නිලධාරීන් 38 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීමේ නිර්දේශ ජාතික පොලිස් කොමිසම වෙතින් ලබා ගැනීම සඳහා යොමු කර ඇත. රාජ්‍ය නිවේදිත නිලධාරීන් 05 දෙනෙකු 2017 වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා ද අනුමැතිය ලබා දී ඇත.

- අමාත්‍යාංශ අනුමත බල අධිකාරී සීමාවන්ට අයත් විශේෂ කාර්ය බලකායේ සහ ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් විශ්‍රාම ගැන්වීමට අදාළව රාජ්‍ය නිවේදිත නිලධාරීන් 41 දෙනෙකුට විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර නිලධාරීන් 49 දෙනෙකුගේ විශ්‍රාම ගැන්වීමේ නිර්දේශ ජාතික පොලිස් කොමිසම වෙතින් ලබා ගැනීම සඳහා යොමු කර ඇත.

- ශ්‍රී ලංකා පොලීසියේ ද්‍රවිඩ භාෂා හුරුව ඇති නිලධාරීන්ගේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අදාළව පසුගිය වර්ෂය තුළ සේවා නියුක්ත නිලධාරීන් 97 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා පොලීසියේ සහායක සේවා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි අනුමැතිය සඳහා ජාතික පොලිස් කොමිසම වෙත යොමු කිරීම.

- සමාලෝචිත වර්ෂය තුළ නව පොලිස් ස්ථාන සහ මුරපොල 12 ක්, පොලිස් දිසා හතරක් හා කොට්ඨාශ හතරක්, විශේෂිත කොට්ඨාශ අටක් ස්ථාපිත කිරීමටත් එක් පොලිස් මුරපොලක් ඉවත් කිරීමටත් අනුමැතිය ලබා දෙන ලදී.

- ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් 361 දෙනෙකු විදේශ පුහුණු හා සම්මන්ත්‍රණ සඳහාත් නිලධාරීන් 49 දෙනෙකු දේශීය පුහුණු සඳහාත් සහභාගී කරවීමට අනුමැතිය ලබා දීම.

- දේශීය ප්‍රභූ ආරක්ෂාව සම්බන්ධයෙන් නිලධාරීන් අනුයුක්ත කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවන ලද කමිටුව 2017 වසර තුළ වාර දෙකක් රැස්වී ඇති අතර ලැබුණු ඉල්ලීම් 128 ක් සලකා බලා නිලධාරීන් 12 දෙනෙකු අනුයුක්ත කිරීමේ කටයුතු සිදු කර තිබේ.

- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරී සඳහා දකුණු සුඩානය වෙත නිලධාරීන් 20 දෙනෙකු යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් නිලධාරීන් 403 ක් සඳහා පූර්ණ භූමි සම්මානය, නිලධාරීන් 11 ක් සඳහා දේශපුත්‍ර සම්මානය නිලධාරීන් 09 ක් සඳහා පොලිස් වීරතා පදක්කම, නිලධාරීන් 1,306 ක් සඳහා පොලිස් විශිෂ්ට සේවා පදක්කම පිරිනැමීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

- පොලිස් නිලධාරීන්ට විරුද්ධව මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද පැමිණිලි 38 විමර්ශණය කර අගතියටපත් පාර්ශවයන්ට සහන සලසා දීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කිරීම.

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු අමාත්‍ය මණ්ඩල සංදේශ 14 ක් සකස් කර ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා ඊට අදාළව ලබා දුන් තීරණ අනුව කටයුතු කිරීම.

- අමාත්‍ය මණ්ඩලය මඟින් ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සඳහා යොමුකරන වෙනත් අමාත්‍යාංශවල අමාත්‍ය මණ්ඩල සංදේශ 28 ක් සඳහා ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම.

- නීතිය හා සාමය පවත්වාගෙන යාම උදෙසා ශ්‍රී ලංකා පොලිසියේ කාර්යභාර්යය කාර්යක්ෂම හා ඵලදායී කිරීමට ඉන්දුනීසියාව, ඉරානය, තුර්කිය, කටාර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව, රුසියාව, වියට්නාමය, බෙල්ජියම, කොරියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය තජිකිස්ථානය යන රටවල් සහ අන්තර්ජාතික රතුකුරුස කමිටුව, දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානය (සාර්ක්) සහ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ කාර්යාලය යන සංවිධාන සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම හා ගිවිසුම් අත්සන් තැබීමට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම.

- සමාලෝචිත වර්ෂය තුළ වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු වාර්තා 43 ක් හා ස්ථාවර නියෝග 23/2 යටතේ ප්‍රශ්න 09 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) යන ආයතන වෙතින් ඉල්ලුම් කරන ලද නිර්දේශ සඳහා වාර්තා 111 ක් සකස් කර ඉදිරිපත් කිරීම.

- සාර්ක් සංවිධානයට අයත් රටවල අභ්‍යන්තර / ස්වදේශ අමාත්‍යවරුන්ගේ 08 වෙනි රැස්වීම සහ එයට පූර්වගාමීව පැවැත්වෙන සාර්ක් සංවිධානයට අයත් රටවල අභ්‍යන්තර / ස්වදේශ ලේකම්වරුන්ගේ 08 වෙනි රැස්වීම සහ ආගමන බලධාරීන්ගේ 08 වෙනි රැස්වීම 2017 ජූලි 11-13, එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවෙකු වන බෙන් එමර්සන් මහතාගේ සංචාරය 2017 ජූලි 09-15, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ කාර්යාලය කලාපීය සමුළුව 2017 අගෝස්තු 21-22 සහ 2017 ජූනි 05 – 07 දක්වා එක්සත් ජාතීන්ගේ සී.ටී.ඊ.ඩී වැඩමුළුව යන රැස්වීම්, සංචාර, සමුළු සහ වැඩමුළු සංවිධානය සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- චිත්‍රපට රූගත කිරීම්, ටෙලි නාට්‍ය, වෙළඳ දැන්වීම්, විවාහ මංගල්‍ය, විවිධ පුහුණුවීම් සහ වෙනත් ආරක්ෂාව සම්බන්ධව අනුමැතිය ලබා දීම් 231 ට අදාළව කටයුතු කිරීම.

## 3.3. මූල්‍ය අංශය

### 3.3.1. මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය

- 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන ඵලදායී ලෙස කළමනාකරණය කළ අතර ඒ අනුව අමාත්‍යංශ මූල්‍ය ප්‍රගතිය මුළු ප්‍රතිපාදනයෙන් 77% කි (පුනරාවර්තන වියදම් 99%, ප්‍රාග්ධන වියදම් 27%). ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2017 ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා රු. 10,766,056,000 මුදලක් ප්‍රතිපාදනය කර ඇති අතර රු. 8,290,630,554 වියදම් දරා ඇත.

  මුළු ප්‍රතිපාදනය හා මුළු වියදම ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස බෙදී පවතින ආකාරය පහත පරිදි වේ.

**මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය - 2017**

සංඛ්‍යා වගුව - 18

| වියදම් වර්ගය | මුළු ප්‍රතිපාදනය | | මුළු වියදම | | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | වටිනාකම (රු.) | ප්‍රතිශතය | වටිනාකම (රු.) | ප්‍රතිශතය | |
| පුනරාවර්තන | 7,493,361,000 | 70% | 7,403,595,349 | 89% | 99% |
| ප්‍රාග්ධන | 3,272,695,000 | 30% | 887,035,205 | 11% | 27% |
| එකතුව | **10,766,056,000** | **100%** | **8,290,630,554** | **100%** | |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ මූල්‍ය අංශය*



## මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය ව්‍යාපෘති අනුව විස්තරාත්මකව - 2017

සංඛ්‍යා වගුව - 19
රු.'000

| ව්‍යාපෘතිය | වියදම් වර්ගය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් | මු.රෙ 66 මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදන | මුළු වියදම | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | පුනරාවර්තන | 23,550 | - | (100) | 23,450 | 22,592 | 96% |
| | ප්‍රාග්ධන | 2,700 | - | - | 2,700 | 1,283 | 48% |
| අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා | පුනරාවර්තන | 358,770 | 20,000 | (3,575) | 375,195 | 320,823 | 86% |
| | ප්‍රාග්ධන | 62,240 | 100,000 | 3,675 | 165,915 | 30,496 | 18% |
| විශේෂ කාර්ය බලකාය | පුනරාවර්තන | 6,529,266 | 494,600 | - | 7,023,866 | 7,013,724 | 100% |
| | ප්‍රාග්ධන | 677,000 | 1,305,530 | - | 1,982,530 | 609,443 | 31% |
| දක්ෂිණ සංවර්ධනය | පුනරාවර්තන | 28,500 | 20,000 | - | 48,500 | 46,456 | 96% |
| | ප්‍රාග්ධන | 119,050 | 1,000,000 | - | 1,119,050 | 245,813 | 22% |
| රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය | පුනරාවර්තන | 22,350 | - | - | 22,350 | - | - |
| | ප්‍රාග්ධන | 2,500 | - | - | 2,500 | - | - |
| එකතුව | පුනරාවර්තන | 6,962,436 | 534,600 | (3,675) | 7,493,361 | 7,403,595 | 99% |
| | ප්‍රාග්ධන | 863,490 | 2,405,530 | 3,675 | 3,272,695 | 887,035 | 27% |
| මුළු එකතුව | | **7,825,926** | **2,940,130** | - | **10,766,056** | **8,290,630** | **77%** |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ මූල්‍ය අංශය*

### මුළු ප්‍රතිපාදනය සහ වියදම ව්‍යාපෘති අනුව



## 3.3.2. මූල්‍ය කටයුතු පවත්වා ගෙන යාම

- 2018 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී මෙම අමාත්‍යාංශය යටතේ පැවති ආයතනයන් හි අයවැය ඇස්තමේන්තු ද රැස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවීම.

- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් වියදම් හා ලැබීම් සීමාවන් මනා ලෙස කළමනාකරණය කරගනිමින් පවත්වාගෙන යන ලදී. අත්තිකාරම් "බී" ගිණුමේ ආරම්භක ශේෂය 2017.01.01 දිනට රු. 129,161,105.00 වූ අතර එහි අවසාන ශේෂය 2017.12.31. දිනට රු. 107,451,723.69 කි.

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2017 වර්ෂය**

සංඛ්‍යා වගුව - 20
රු.'000

| කාරණය | වියදමෙහි උපරිම සීමාව | ලැබීමේ අවම සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් | 100,000 | 75,000 | 230,000 |
| වර්ෂය අවසානයේ තත්‍ය අගයන් | 82,277 | 100,225 | 107,451 |
| එකතුව | 182,277 | 175,225 | 337,451 |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ ගිණුම් අංශය*

- මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළයුතු පහත වාර්තා අදාළ කාල සීමාවන් තුළ නියමිත පරිදි යොමු කිරීමට කටයුතු කිරීම.
  - මාසික අක් මුදල් ඉල්ලුම් පත්‍රය - සෑම මාසයකම වැඩ කරන පළමු දිනයන්හිදී
  - මාසික ගිණුම් සාරාංශය - සෑම මසකම මුල් දින 02 තුළදී
  - 2016 වාර්ෂික ගිණුම් සාරාංශයේ පළමුවෙනි පරිපූරකය - 2017 වර්ෂයේ ජනවාරි 18 ට පෙර
  - 2016 වාර්ෂික ගිණුම් සාරාංශයේ දෙවෙනි පරිපූරකය - 2017 වර්ෂයේ ජනවාරි 31 ට පෙර
  - වැටුප් හා සේවක සංඛ්‍යා පිළිබඳ වාර්තාව - සෑම මාසයකම 15 ට පෙර
  - පොදු 172 කුවිතාන්සි පිළිබඳ වාර්තාව - සෑම මාසයකම 10 ට පෙර
  - නිල බැංකු ගිණුම් පිළිබද වාර්තාව - සෑම මාසයකම 15 වන දිනට පෙර
  - අග්‍රිම ගිණුම් සැසඳුම් වාර්තාව - කාර්තුවකට වරක්
  - 2016 පොදු තැම්පතු ගිණුම් ශේෂ වාර්තාව - 2017 වර්ෂයේ වැඩ කරන පළමු දිනයන්හිදී
  - 2018 මු.රෙ 135 බලය බෙදා දීමේ වාර්තාව - 2017 වර්ෂයේ අවසාන දිනට පෙර
  - 2018 වාර්ෂික අක් මුදල් ඉල්ලුම් පත්‍රය - 2017 වර්ෂයේ දෙසැම්බර් අවසාන දිනට පෙර

- විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු මාසික බැංකු සැසඳුම් වාර්තා සෑම මසකම 15 වන දිනට පෙර ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ කටයුතු, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා නියෝග වලට අනුකූලව පවත්වාගෙන යන ලද අතර මේ අනුව සියළුම ලැබීම් ගෙවීම් කටයුතු හා ගිණුම් කටයුතු නිසි ලෙස පවත්වාගෙන යන ලදී.

- 2016 වර්ෂයේ විසර්ජන ගිණුම් වාර්තාව ඇතුළුව ගිණුම් පියවීමේ චක්‍රලේඛයට අදාළ වාර්තා සහ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සැසඳීමේ වාර්තාව නියමිත දිනට පෙර අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇත.

## 3.3.3. අමාත්‍යාංශය සහ ඒ යටතේ පැවති ආයතනවලට අයත් ප්‍රසම්පාදනයන් සිදු කිරීම

- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (ඉදිකිරීම්) වාර 05 ක් සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (භාණ්ඩ) වාර 03 ක් රැස්වී ඇති අතර පහත ව්‍යාපෘති සම්බන්ධව තීරණ ගෙන ඇත.

**නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**

**1.)** 2017.07.11 සිට 2017.07.13 දක්වා පැවති සාර්ක් සංවිධානයට අයත් රටවල අභ්‍යන්තර/ස්වදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ, අභ්‍යන්තර/ස්වදේශ කටයුතු ලේකම්වරුන්ගේ හා ආගමන බලධාරීන්ගේ අට වන සමුළුව හා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව පහත තීරණ ගන්නා ලදී.

- සමුළුව සඳහා පැමිණෙන නියෝජිතයන් නවාතැන් ගැන්වීම සඳහා සුදුසු හෝටලයක් වෙන්කරගැනීමේ ටෙන්ඩරය රු.8,275,943.30 ක (වැට් රහිත) මුදලකට 2017.06.22 දින ප්‍රධානය කිරීමට තීරණය කිරීම.

- සමුළුව සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව කල්බදු ක්‍රමයට වාහන ලබා ගැනීම පිළිබඳ ටෙන්ඩරය 2017.07.07 දින ප්‍රධානය කිරීමට තීරණය කිරීම.

- සමුළුව සඳහා අවශ්‍ය ලිපිගොනු බෑග 100 ක් මිලදී ගැනීම පිළිබඳ ටෙන්ඩරය රු.250,000.00 ක (වැට් රහිත) මුදලකට 2017.07.04 දින ප්‍රධානය කිරීමට තීරණය කිරීම.

- දින 03 ක් පුරාවට පැවැති සාර්ක් සංවිධානයට අයත් රටවල අභ්‍යන්තර/ස්වදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ, අභ්‍යන්තර/ස්වදේශ කටයුතු ලේකම්වරුන්ගේ සහ ආගමන බලධාරීන්ගේ 8 වන සමුළුව සඳහා ඉසව් කළමනාකරණ සේවාව ලබාගැනීම සඳහා වූ ටෙන්ඩරය රු.1,109,300.00 (වැට් රහිත) මුදලකට 2017.07.10 දින ප්‍රධානය කිරීමට අදාලව ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- සාර්ක් සමුළුව සඳහා සහභාගී වූ නියෝජිතයන් හට මෙම අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් පවත්වන්නට යෙදුණු රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමේ ටෙන්ඩරය රු.445,900.00 (වැට් රහිත) මුදලකට 2017.07.04 දින ප්‍රධානය කිරීමට තීරණය කරන ලද අතර ඒ අනුව එම සංග්‍රහය කොළඹ කිංග්ස්බරි හෝටලයේදී පවත්වන්නට යෙදුණි.

- එම නියෝජිතයන් සඳහා රාත්‍රී භෝජන සංග්‍රහයක් ගරු අමාත්‍යතුමන් විසින්ද සංවිධානය කර තිබූ අතර එය අරලියගහ මන්දිරයේදී පැවැත්විණි. ඒ සඳහා රාත්‍රී ආහාර සැපයීම සඳහා වෙන් කර ගැනීමේ ටෙන්ඩරය රු.660,000.00 මුදලකට 2017.07.11 දින ප්‍රධානය කිරීමට තීරණය කරණු ලැබිණ.

**විශේෂ කාර්ය බලකාය**

**1.) කැබිනට් මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව**

- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකා නිලධාරීන් යෙදවීමට අදාලව සංග්‍රාමික වාහන 06ක් ලබා ගැනීමේ ටෙන්ඩරය 2017.12.11 දින රු.1,729,072.80 ක මුදලකට ප්‍රධානය කිරීම.

- විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සඳහා කලපළුවාව විවාහක නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම පිළිබඳ ටෙන්ඩරය 2017.12.05 දින කමිටුව රැස්වූ අවස්ථාවේදී රුපියල් මිලියන 289.59 මුදලකට ප්‍රධානය කිරීමට තීරණය කිරීම.

**2.) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම්**

- මහඔය පිහිටි රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ නිවස්නය ඉදිකිරීම පිළිබඳ ටෙන්ඩරය 2017.06.17 දින රු. 17,374.420.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීම.

- කටුකුරුන්ද පිහිටි පොලිස් අභ්‍යාස විද්‍යාලයෙහි ගොඩනැගිලි අංක 54 ඉදිකිරීම පිළිබඳ ටෙන්ඩරය 2017.05.08 දින රු. 66,631,205.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීමට ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

**3.) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ**

- විශේෂ කාර්ය බලකාය සඳහා කළු හම් සපත්තු යුගල 5,000 ක් මිලට ගැනීමේ ටෙන්ඩරය 2017.08.18 දින රු. 14,315,027.50 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීම.

- විශේෂ කාර්ය බලකාය සඳහා ලෙදර් බූට් සපත්තු යුගල 8,000 ක් මිලට ගැනීමේ ටෙන්ඩරය 2017.10.11 දින රු. 33,914,400.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීම.

- විශේෂ කාර්ය බලකාය සඳහා කම්බැට් හාර්නස් 2,500 ක් මිලට ගැනීමේ ටෙන්ඩරය 2017.09.06 දින රු. 11,882,648.70 (වැට් රහිත) මුදලකට ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ රාජකාරි සඳහා යොදවන නිලධාරීන්ගේ අවශ්‍යතා සඳහා ජල පෙරන යන්ත්‍ර සහ උපකරණ ලබා ගැනීමේ ටෙන්ඩරය 2017.09.18 දින රු. 38,589,411.97 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීම.

- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ රාජකාරි සඳහා යොදවන නිලධාරීන්ගේ අවශ්‍යතා සඳහා කන්ටේනර්ස් 21 ක් ලබා ගැනීමේ ටෙන්ඩරය 2017.09.20 දින රු.56,690,000.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කෙරිණ.

- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ රාජකාරි සඳහා යොදවන නිලධාරීන්ගේ අවශ්‍යතා සඳහා සන්නිවේදන උපකරණ ලබාගැනීමේ ටෙන්ඩරය 2017.09.29 දින රු. 121,412,359.41 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීමට කටයුතු කිරීම.

- එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවේ රාජකාරි සඳහා යෙදෙන නිලධාරීන්ගේ අවශ්‍යතා සඳහා වෛද්‍ය උපකරණ ලබාගැනීමේ ටෙන්ඩරය 2017.09.06 දින රු.3,320,606.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීමට අදාලව ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි සඳහා යොදවන නිලධාරීන්ගේ අවශ්‍යතා සඳහා අවි උණ්ඩ, කැරලි මර්දන උපකරණ ලබා ගැනීමේ ටෙන්ඩරය 2017.08.18 දින රු. 60,260,000.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීම.

- විශේෂ කාර්ය බලකාය සඳහා ක්‍රීඩා සපත්තු 6,000 ක් මිලට ගැනීමේ ටෙන්ඩරය 2017.10.27 දින රු. 17,442,500.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීමට කටයුතු කෙරිණ.

- විශේෂ කාර්ය බලකාය සඳහා වතුර බවුසරයක් (3500-6000සී.සී.) මිලට ගැනීමේ ටෙන්ඩරය 2017.08.18 දින රු. 12,500,000.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීමට ප්‍රසම්පාදන තීරණ ගනු ලැබිණ.

- විශේෂ කාර්ය බලකාය සඳහා සැහැල්ලු වාහන රැගෙන යන වාහන (3500-6000සී.සී.) මිලට ගැනීමේ ටෙන්ඩරය 2017.08.18 දින රු. 10,250,000.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීම.

- විශේෂ කාර්ය බලකාය සඳහා මෝටර් සයිකල් 40 ක් මිලට ගැනීමේ ටෙන්ඩරය 2017.09.11 දින රු. 35,950,000.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීමට කටයුතු කෙරිණි.

- විශේෂ කාර්ය බලකාය සඳහා ට්‍රක් රථ මිලට ගැනීමේ ටෙන්ඩරය 2017.10.26 දින රු. 9,500,000.00 (වැට් රහිත) මුදලකට ප්‍රධානය කිරීමට ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- විශේෂ කාර්ය බලකායේ වාහන සහ මෝටර් සයිකල් සඳහා ටයර් මිලදී ගැනීමේ ටෙන්ඩරය රු. 11,882,648.70 (වැට් රහිත) මුදලකට 2017.09.06 දින ප්‍රධානය කිරීමට තීරණය කරන ලදී.

- **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීම**

  ශ්‍රී ලංකා පොලීසියට අදාලව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශයන් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන 04 ක් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත. උණ්ඩ 2,000,000 ක් මිලදී ගැනීම, සපත්තු ජෝඩු 28,000 ක් මිලදී ගැනීම, වැහි කබා 20,000 ක් මිලදී ගැනීම, තිරුක්කෝවිල් නව පොලිස් ස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම එම ප්‍රසම්පාදන කටයුතු වේ.

- **ප්‍රසම්පාදන ලංසු විවෘත කිරීම**

  2017 වර්ෂය තුළ ලංසු විවෘත කිරීම් 29 ක් සිදු කර ඇත. ඉන් 03 ක් අමාත්‍යාංශයටත්, 25 ක් විශේෂ කාර්ය බලකායටත් අදාල ප්‍රසම්පාදන කටයුතු වන අතර එකක් ශ්‍රී ලංකා පොලීසියට අදාල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් වේ.

- ප්‍රසම්පාදනයන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ පැනනඟින ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කිරීමේ අරමුණින් 2017 වර්ෂය තුළදී ප්‍රසම්පාදන ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර 04 කදී පවත්වා ඇත.

- ප්‍රසම්පාදනයන්ට අදාළව ණයවර ලිපි ලබාගැනීමට අවශ්‍ය වූ අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකා පොලීසිය වෙනුවෙන් ණයවර ලිපි 07ක් සහ විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් එක් ණයවර ලිපියක් නිකුත් කර ඇත.

## 3.3.4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම්

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශ 03 ක් සකස් කර ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සහ අදාළ අනුමැතිය ලද පසු ඒ අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## 3.4. සැලසුම් අංශය




- රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 අනුව 2018 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන සහ අයවැය යෝජනා වලට අදාළ ඇස්තමේන්තුවලට අනුකූලව අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල අදාල නිලධාරීන් එක්ව රැස්වීමක් පවත්වා ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අදාළ ආයතන වලට ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලංකා පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ සංවර්ධන ව්‍යාපෘති යෝජනා 14 ක් ඇගයීමට ලක් කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ අයවැය දෙපාර්තමේන්තුවට ලබා දීමට හැකිවන සේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ 15 ක් සකස් කර ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සහ අදාළ අනුමැතිය ලද පසු එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන වෙත ලබාදීම හා ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම. මේ යටතේ අමාත්‍යාංශයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 01 ක්, ශ්‍රී ලංකා පොලිසියට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 09 ක් සහ විශේෂ කාර්ය බලකායට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 05 ක් ඉදිරිපත් කර ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 අනුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 01 ක් අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම.

- අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මාසික සහ කාර්තුමය ප්‍රගති වාර්තා සකස්කර ජනාධිපති ලේකම් කාර්යාලයට, ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශයේත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වලත් වර්ෂයේ ක්‍රියාකාරකම්, සැලසුම් කළ ආකාරයෙන් ඉටුකරන්නේද යන්නත්, විචලතා ඇත්නම් ඊට හේතුත්, ගැටළු සඳහා ගතයුතු පියවර පිළිබඳවත් විමසීම සහ සාකච්ඡා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් හතරක් (04) වර්ෂය තුළ පැවැත්වීම හා ඊට අදාළ පසු විපරම් කටයුතු සිදුකිරීම.



*ප්‍රගති සමාලෝචන රැස්වීමක අවස්ථාවක්*

- රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 අනුව සැකසූ අමාත්‍යාංශයේ 2016 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව නියමිත දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ත්‍රෛභාෂාවෙන් මුද්‍රිත හා සීඩී පට ආකාරයෙන් සකස් කර ඉදිරිපත් කිරීම සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.



- ශ්‍රී ලංකා පොලිසියේ 2016 වර්ෂයේ කාර්ය සාධන වාර්තා, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2014 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව යන කාර්යසාධන වාර්තා ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතු ආවරණ ලිපි සමඟ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.

- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2018 අය වැය විසර්ජන පනත සාකච්ඡාවට ගනු ලැබූ 2017.11.18 දින පැවති පාර්ලිමේන්තු විවාදයේදී ප්‍රයෝජනයට ගතහැකි වනසේ ප්‍රගති වාර්තාව 2017 ප්‍රකාශනය ත්‍රෛභාෂාවෙන් මුද්‍රිත හා සීඩී පට ආකාරයෙන් සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.



- ශ්‍රී ලංකා මහ බැංකුවේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම.

- දක්ෂිණ සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය වශයෙන් දක්ෂිණ ප්‍රදේශයේ ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක වල විමධ්‍යගත අය වැය වැඩසටහන ක්‍රියාත්මක කරමින් ව්‍යාපෘති අනුමත කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය දරණු ලබන අතර ඒ සම්බන්ධ කටයුතු සැලසුම් අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව එක් එක් දිස්ත්‍රික්කයේ 2017 අනුමත ව්‍යාපෘති ගණන පහත වගුවෙන් දැක්වේ.

**විමධ්‍යගත අය වැය වැඩසටහන ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 21**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රතිපාදන ප්‍රමාණය 2017 (රු.මි.) | පාර්ලිමේන්තු මන්ත්‍රීන් ගණන | අනුමත කරන ලද ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|
| 01 | ගාල්ල | 100 | 10 | 874 |
| 02 | මාතර | 80 | 08 | 706 |
| 03 | හම්බන්තොට | 70 | 07 | 597 |
| 04 | මොණරාගල | 50 | 05 | 476 |
| 05 | රත්නපුර | 110 | 11 | 862 |
| **එකතුව** | | **410** | **41** | **3,515** |

*මූලාශ්‍රය- සැලසුම් අංශය*

- 2017 වර්ෂය තුළ දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය සඳහා 2016 අයවැය කථාවේදී වෙන්කළ රු.මි.1,000 ක ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ව්‍යාපෘති 724 ක් දිස්ත්‍රික්ක පහ තුළම ක්‍රියාත්මක කිරීම සඳහා අක්මුදල් නිදහස් කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට අවශ්‍ය නිර්දේශය ලබා දීමට අදාළ ව්‍යාපෘති වාර්තා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

## 3.5. සංවර්ධන අංශය

- ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් ස්ථාන, පොලිස් මුරපොළවල්, රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ නිවාඩු නිකේතන ආදිය සඳහා හා විශේෂ කාර්ය බලකා කඳවුරු සඳහා ඉඩම් 560 ක ප්‍රමාණයක් පවරා ගැනීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ගගෙන ඉන් ඉඩම් 250 ක නිරවුල්භාවය පරීක්ෂා කිරීම අවසන් කර ඇත.

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීම් සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කළ අතර මණ්ඩලයේ නිලධාරීන් 13 දෙනෙකු විදේශ පුහුණු සඳහා යොමු කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලදී.

- ගාලු උරුමය පදනමේ 2017 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම සහ අඩුපාඩු පෙන්වා දෙමින් ඉදිරි සැලසුම් සහ රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම සම්බන්ධ උපදෙස් ලබා දීම.

- ගාලු උරුමය පදනමේ කාර්යය භාර්යය වඩාත් විධිමත් කිරීමේ අරමුණින් ගාලු උරුමය පදනමේ පනත, දක්ෂිණ ප්‍රදේශය ඇතුළත් කරමින් දකුණු උරුමය පනත් කෙටුම්පත ලෙස යාවත්කාලීන කර ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීම.

- පොලිස් ප්‍රතිසංවිධානය සහ යෝජිත පොලිස් සහ අපරාධ යුක්ති විශ්ව විද්‍යාලය යන ව්‍යාපෘතීන්ට අදාළව අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ කටයුතු සඳහා දායකත්වය ලබා දීම.

- දක්ෂිණ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය විමසීම සඳහා අදාල නිලධාරීන් සහභාගී කර ගනිමින් 2017 වර්ෂයේ දෙසැම්බර් මස සමාලෝචන කටයුතු ආරම්භ කළ අතර රැස්වීම් වාර 02 ක් එම මස පවත්වන්නට යෙදුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දක්ෂිණ සංවර්ධන ව්‍යාපෘතීන් 41 ක පවතින ගැටළු අතුරින් ව්‍යාපෘතින් 22 ක මූලික ගැටළු විසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට හැකියාව ලැබිණි.

- දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලයේ කාර්යයන් පහසු කිරීම උදෙසා 2017.08.22 දිනෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලද තනතුරු 79 ක් දක්ෂිණ සංවර්ධන අංශය සඳහා ස්ථාපිත කරන ලදී. එම තනතුරු අතරින් නියෝජ්‍ය අධ්‍යක්ෂ, මණ්ඩල ලේකම්/ නීති නිලධාරී සඳහා නිලධාරියෙකු බැගින් බඳවා ගැනීම් සිදු කළ අතර තාක්ෂණ සහකාර තනතුර සඳහා නිලධාරීන් තිදෙනෙකු බඳවා ගන්නා ලදී. තවත් තනතුරු 70 ක් සඳහා බඳවා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු කරන ලදී.

- දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලයේ පුරප්පාඩු පවතින අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කිරීම.

- දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක තනතුරක් අමාත්‍යාංශයේ ස්ථාපිත කිරීම සඳහා 2017.08.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අවශ්‍ය පියවර ගන්නා ලදී.

- 2017.08.04 දිනැති ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු තීරණයට අනුව ගාලු කොටුව තුළ පිහිටි ආයතන දෙකක් සංචාරක කටයුතු ප්‍රවර්ධනයට උචිත පරිදි නවීකරණය කිරීමේ යෝජනා සම්බන්ධයෙන් කටයුතු කළ අතර එම තීරණ ප්‍රකාරව ගාලු කොටුවේ පිහිටි ගොඩනැගිලි වල පවත්වා ගෙන යනු ලැබූ රාජ්‍ය ආයතන 05 ක් ඉන් ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීම.

## 3.6. අභ්‍යන්තර විගණන අංශය

- 2017 වර්ෂය සඳහා අමාත්‍යාංශය, විශේෂ කාර්ය බලකාය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ගාලු උරුමය පදනම යන ආයතන වල වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීම.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අභන්තර විගණන අංශවල සමාලෝචන කටයුතු, විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රගතිය, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය ඇතුළු අනෙකුත් මූල්‍ය හා පරිපාලන කටයුතුවලට අදාළ චක්‍රලේඛ හා නීති රීති අනුව ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ විචලතා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවනසේ විගණන සැලැස්මට අනුව පළමු, දෙවන, තෙවන හා සිව්වන කාර්තු සඳහා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

- අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින අනෙකුත් ආයතන වෙත විගණකාධිපති විසින් නිකුත් කරනු ලැබූ විගණන විමසීම් සඳහා පිළිතුරු කැඳවීම, සම්බන්ධීකරණය හා එම කටයුතු පසු විපරම් කිරීම. මේ යටතේ විගණන විමසීම් 04 කට පිළිතුරු කැඳවීම හා සම්බන්ධීකරණය කර තිබේ.

- ආයතනික අභ්‍යන්තර ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා විශේෂ කාර්ය බලකායේ ශාස්ත්‍රවේලී, වව්නියාව, ආරුගම්බේ, අම්පාර, මස්කෙළිය හා ධනගිරිය යන කඳවුරු සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නව දිගන්තය හා ගාල්ල පුනරුත්ථාපන මධ්‍යස්ථාන වල අභ්‍යන්තර විගණන කටයුතු පරික්ෂා කළ අතර ගාලු උරුමය පදනමේ ආයතනික පාලන හා ගිණුම් ක්‍රමවේදයන් නිවැරදි කිරීම සඳහා විගණන පරික්ෂාවක් සිදු කිරීම.

- 2017 අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අමාත්‍යාංශයේ සහ අනුබද්ධ ආයතනවල විගණන කටයුතු සිදු කිරීම සහ ඊට අදාළව අභ්‍යන්තර විගණන විමසුම් 14 ක් ඉදිරිපත් කිරීම.

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අත්තිකාරම් "බී" ගිණුම යාවත්කාලීන කිරීම සහ මණ්ඩලයේ මධ්‍යස්ථානවල ජංගම නොවන වත්කම් සත්‍යාපනය කිරීම

- 2017 වර්ෂය තුළදී අමාත්‍යාංශය වෙත යොමු කරන ලද පෙත්සම් 05 ක් විභාග කර විමර්ශන වාර්තා ලබා දීමට කටයුතු කිරීම.

- 2017 වර්ෂය තුළදී සිදු කරන ලද විගණන කටයුතු සම්බන්ධයෙන් කාර්තුමය වාර්තා 04 ක් සකස් කර කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

- අමාත්‍යාංශය හා ඒ යටතට ගැනෙන සියළු ආයතනවල රජයේ විගණකාධිපති විගණන විමසුම්, අභ්‍යන්තර විගණන විමසුම් හා ඒවාට පිළිතුරු ලැබීම් පිළිබඳව විගණන විමසුම් ලේඛණය පවත්වාගෙන යාම.

- අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන වල අභ්‍යන්තර ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ප්‍රශ්නාවලි හතරක් අදාල ආයතන වෙත යොමු කිරීම සහ එම ආයතන වල මාසික මූල්‍ය වාර්තා පරික්ෂා කිරීම හා ඇගයීම.